# 4. කර්මාන්ත

## 4.1 සමස්ත උපනතීන්

1999 වසරේදී කම්හල් කර්මාන්ත අංශයෙහි නිමැවුම පදනම් කරගෙන ගණනය කරන ලද කාර්මික නිමැවුමෙහි සියයට 4.5 ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කෙරිණි. කම්හල් කර්මාන්ත අංශයෙහි නිමැවුම කාර්මික නිෂ්පාදන-යෙන් සියයට 84 ක් වූ අතර එය 1999 වසරේ සමස්ත ආර්ථික වර්ධනයට සියයට 17 කින් දායක විය. 1999 වසරේ පසු භාගයේදී කර්මාන්ත අංශය යථා තත්ත්වයට පත් වීම සලකුණු කරමින් සිව් වන කාර්තුවේදී නිමැවුම සියයට 7.7 කින් වර්ධනය විය. ජපානය සහ නැගෙනහිර ආසියාතික රටවල ආර්ථිකයන් යථා තත්ත්වයට පත් වීම හා ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයෙහි සවිමත් ආර්ථික වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස අපනයනාභිමුඛ කර්මාන්ත කැපී පෙනෙන අන්දමින් යථා තත්ත්වයට පත් විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයෙහි වර්ධනය සහ ජපාන ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමෙන් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා පැවැති ඉල්ලුම ඉහල ගිය අතර සමහර නැගෙනහිර ආසියාතික රටවල මුදලේ අගය ඉහළ යාම ශ්‍රී ලංකාවේ අපනයනවල තරඟකාරිත්වය වැඩි වීමට හේතු විය.

භාණ්ඩ විවිධාංගීකරණය සහ කර්මාන්ත ස්ථානගත වීම විවිධාංගීකරණය සමග පෞද්ගලික අංශය මුල් කර ගත් අපනයනාභිමුඛ කර්මාන්ත වර්ධනය 1999 වසරෙහි කර්මාන්ත ප්‍රතිපත්තිවල මූලික අරමුණ විය. විනිවිද පෙනෙන සහ සරල කාර්මික ප්‍රතිපත්ති අරමුණු කරමින් ආයෝජන මණ්ඩලයට අයත් හා අයත් නොවන කර්මාන්ත සඳහා සමාන දිරි ගැන්වීම් ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවය වසර 2000 සඳහා වූ අයවැය මගින් අවධාරණය කර ඇත. පුහුණු ශ්‍රම බලකායක් වර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ප්‍රදානය කෙරුණ දිරි ගැන්වීම් 1999 දී ද නොකඩවා ක්‍රියාත්මක විය. විද්‍යුත් උපකරණ සහ විද්‍යුත් උපකරණ එකලස් කිරීමේ කර්මාන්ත සඳහා වූ උපාංග, පිඟන්, වීදුරු භාණ්ඩ සහ ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන, රබර් ආශ්‍රිත කර්මාන්ත, ලුහු සහ බැර ඉංජිනේරු කර්මාන්ත වැනි "ප්‍රමුඛතාව දිය යුතු" යයි හඳුනා ගත් කර්මාන්තවල වැදගත් සහ ප්‍රමුඛ කාර්යභාරය හඳුනා ගනිමින් මෙම කර්මාන්තවලට ප්‍රදානය කෙරුණු දිරි ගැන්වීම් නොකඩවා ලබා දුනි. උසස් තාක්ෂණය භාවිත කරණු ලබන කර්මාන්ත සඳහා ප්‍රදානය කෙරුණ දිරි දීමනා නොකඩවා පවත්වා ගෙන යනු ලැබූ අතර තොරතුරු තාක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා 2000 අයවැය මගින් වැඩිමනත් ක්‍රියා මාර්ග යෝජනා කර ඇත.


ශ්‍රී ලංකාවේ කර්මාන්ත වලින් විශාලතම කර්මාන්තය වන ඇඟළුම් කර්මාන්තයෙහි නිමැවුම වසර තුළදී සියයට 8.4 කින් වර්ධනය විය. කෙසේ වෙතත් ඇඟළුම් අපනයන මිල ගණන් වසර තුළදී සියයට 9.2 කින් පහත වැටිණි. 1999 වසරෙහි කාර්මික අංශයෙහි වර්ධනයට ඇඟළුම් කර්මාන්තය සියයට 63 කින් දායක විය. 1999 වසරේ පසු භාගයේදී සකස් කල දියමන්ති, පාවහන්, ප්ලාස්ටික්, සකස් කළ පළතුරු, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ වැනි අපනයනාභිමුඛ අනිකුත් කර්මාන්තද කැපී පෙනන අන්දමින් යථා තත්ත්වයට පත් විය. දේශීය වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කෙරෙන කර්මාන්තයන්හි මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරමින් තිරිඟු පිටි, සැකසූ මස්, ප්ලාස්ටික් සහ පී.වී.සී., ඖෂධ, සනීපාරක්ෂක ද්‍රව්‍ය, සිමෙන්ති, ගොඩනැගිලි ද්‍රව්‍ය, මූලික ලෝහ නිෂ්පාදන සහ සකස් කල ලෝහ නිෂ්පාදන කැපී

**4.1 රූප සටහන**

**කාර්මික නිෂ්පාදන වර්ධනය සහ සංයුතිය**


4.1.1 රූප සටහන

කාර්මික නිෂ්පාදන වර්ධනය




4.1.2 රූප සටහන

**කාර්මික නිෂ්පාදනයේ සංයුතිය - 1999**




1. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත
2. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත
3. දැව හා දැව නිෂ්පාදිත
4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත
5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත
6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත
7. මූලික ලෝහ නිෂ්පාදිත
8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ
9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත

පෙනෙන ලෙස වර්ධනය වූ අතර, මත්පැන් ස්ප්‍රීතු, දුම්කොළ සහ ඛනිජ තෙල් නිෂ්පාදන පහත වැටුණි. ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත අංශයෙහි ශ්‍රම ඵලදායිතාවය 1999 වසරේදී සියයට 1.9 කින් වැඩි වූ අතර නිෂ්පාදන ධාරිතාවය සියයට 2.1 කින් පුළුල් විය.

1999 වසරේ අග භාගයේ පැවති ඉහළ ක්‍රියාකාරිත්වය සඳහා සමහර කර්මාන්ත නවීකරණය කිරීමද හේතුවිය. නවීකරණ කටයුතු පහසු කිරීම පිණිස "උසස් තාක්ෂණ වැඩසටහන" යටතේ පිරිනමන ලද මූල්‍ය දිරිගැන්වීම්ද යම්තාක් දුරට හේතු විය. මෙම වැඩසටහන යටතේ 1999 වසර අවසානයේදී නිෂ්පාදකයින් 356 දෙනෙකු විසින් රුපියල් දශ ලක්ෂ 9,520 ක වටිනාකමින් යුත් යන්ත්‍රසූත්‍ර ආනයනය කර ඇත. බොහෝ කර්මාන්තකරුවන් උප කොන්ත්‍රාත් දීම, වෙනත් නිෂ්පාදකයින් වෙතින් නිෂ්පාදන මිලදී ගැනීම, අපතේ යාම් අඩු කිරීම සහ අපතේ යන ද්‍රව්‍ය නැවත ප්‍රයෝජනයට ගැනීම, ශ්‍රම ප්‍රතිසංවිධානය සහ කාර්යක්ෂම මිලදී ගැනීම් වැනි පිරිවැය අඩු කිරීමේ විවිධ ක්‍රම ක්‍රියාවට නැංවූහ. අමු ද්‍රව්‍ය මිල පහල යාමේ ලෝක ප්‍රවණතාවයද නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීම සඳහා උපකාරී විය. නිෂ්පාදන පිරිවැය අඩු වීම, තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා ගැණුම්කරුවන්ට ඉහළ වට්ටම් පිරි නැමීමට උපකාරී විය. ප්‍රධාන ජාත්‍යන්තර ගැණුම්කරුවන් සමග සමීප වෙළඳ සම්බන්ධතා පවත්වාගෙන යාමට හැකි වීම ප්‍රධාන පෙළේ නිෂ්පාදකයින් කිහිප දෙනෙකුට සිය අපනයන ඇණවුම් නොකඩවා ලබා ගැනීමට උපකාරී විය. ඒකාබද්ධ ව්‍යාපෘති පිහිටුවීම, බෙදා හැරීමේ දින සහ ගිවිස ගත් ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදන සැපයීම අපනයන ඇණවුම් ගලාඒමට දායක විය. උද්ධමනය පහත වැටීම, පොලී අනුපාතික සාපේක්ෂ වශයෙන් ස්ථාවර මට්ටමක පැවතීම සහ තරඟකාරී රටවලට එරෙහි මූර්ත සඵල විනිමය අනුපාතිකය සියයට 4 කින් පමණ අවප්‍රමාණය වීම යන කරුණු දේශීය වෙළෙඳපොළ තත්ත්වය වාසි සහගත වීමට හේතු විය.

විදුලි සංදේශ අංශයෙහි වර්ධනය, ප්‍රාදේශීය කර්මාන්ත පුර වැඩසටහන යටතේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඇඟළුම් පංගු පරිපාලනය දියුණු වීම, ආයෝජන මණ්ඩලය යටතේ නොගැනෙන ආයතන වලට ද විදේශ මුදල් ණය ලබා ගැනීමට තිබූ හැකියාව සහ රෙදිපිළි අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන කාර්මික අංශයෙහි වර්ධනයට තවදුරටත් හේතු විය. වසර තුළදී ආයෝජන මණ්ඩලය හා කර්මාන්ත

**4.1 සංඛ්‍යා සටහන**
**කර්මාන්ත අංශයේ නිෂ්පාදන වටිනාකම**
**(1990 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩය | රුපියල් දශ ලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999(අ) | 1998 | 1999(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 33,641 | 35,908 | 37,146 | 40,756 | 41,742 | 9.7 | 2.4 |
| ආහාර සහ වෙනත් | 19,936 | 21,314 | 22,343 | 24,910 | 26,330 | 11.5 | 5.7 |
| මත්පැන් | 2,630 | 3,027 | 2,961 | 3,458 | 3,327 | 16.8 | -3.8 |
| පාන වර්ග | 4,961 | 5,104 | 6,032 | 6,590 | 6,432 | 9.3 | -2.4 |
| දුම්කොළ නිෂ්පාදිත | 6,114 | 6,463 | 5,810 | 5,798 | 5,653 | -0.2 | -2.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 55,980 | 58,832 | 69,769 | 72,943 | 78,282 | 4.5 | 7.3 |
| ඇඟළුම් | 47,202 | 49,792 | 59,780 | 62,602 | 67,861 | 4.7 | 8.4 |
| රෙදිපිළි | 6,202 | 6,299 | 6,926 | 7,226 | 7,197 | 4.3 | -0.4 |
| සම් භාණ්ඩ | 2,576 | 2,741 | 3,063 | 3,115 | 3,224 | 1.7 | 3.5 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,243 | 1,321 | 1,334 | 1,378 | 1,423 | 3.3 | 3.3 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 3,508 | 3,550 | 3,561 | 3,446 | 3,412 | -3.2 | -1.0 |
| 5. රසායනික ද්‍රව්‍ය,ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 27,043 | 30,635 | 32,082 | 36,223 | 36,281 | 12.9 | 0.2 |
| රසායනික ද්‍රව්‍ය, තීන්ත වර්ග සහ පොහොර | 3,735 | 4,091 | 4,584 | 5,182 | 5,571 | 13.0 | 7.5 |
| රබර් | 3,956 | 4,660 | 5,539 | 6,015 | 6,082 | 8.6 | 1.1 |
| ප්ලාස්ටික් සහ පීවීසී | 2,754 | 3,113 | 3,584 | 3,874 | 4,292 | 8.1 | 10.8 |
| ඖෂධ, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත් | 6,885 | 7,784 | 8,797 | 9,853 | 10,336 | 12.0 | 4.9 |
| ඛනිජ තෙල් | 9,713 | 10,987 | 9,578 | 11,299 | 10,000 | 18.0 | -11.5 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 12,516 | 13,360 | 13,914 | 14,619 | 15,740 | 5.1 | 7.7 |
| දියමන්ති සැකසීම | 4,930 | 4,842 | 4,753 | 4,360 | 5,049 | -8.3 | 15.8 |
| පිඟන් නිෂ්පාදන | 1,567 | 1,838 | 1,926 | 1,991 | 2,029 | 3.4 | 1.9 |
| සිමෙන්ති | 3,316 | 3,607 | 3,896 | 4,628 | 4,785 | 18.8 | 3.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් | 2,703 | 3,073 | 3,339 | 3,640 | 3,877 | 9.0 | 6.5 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,377 | 1,636 | 1,671 | 1,856 | 1,917 | 11.1 | 3.3 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 6,139 | 6,252 | 7,437 | 8,235 | 8,680 | 10.7 | 5.4 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 3,005 | 3,443 | 3,904 | 4,093 | 4,375 | 4.8 | 6.9 |
| එකතුව | 144,452 | 154,937 | 170,818 | 183,549 | 191,852 | 7.5 | 4.5 |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ මුළු නව ව්‍යවසායයන් සංඛ්‍යාව 153 කි. උද්ධමනය පහළ මට්ටමක පැවතීම හා බොහෝ කර්මාන්තයන්හි ලාභදායීතාවය අඩු වීම හේතුවෙන් 1999 වසරේදී වැටුප් වැඩි කිරීම සඳහා වූ බලපෑම් අඩු විය. ශ්‍රම වෙළඳපොළෙහි පවතින අනම්‍ය බව, මහා මාර්ග ඇතුළු යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි සංවර්ධනය නොවීම සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු වැනි කර්මාන්ත අංශයෙහි ව්‍යුහාත්මක ගැටළු මෙම වර්ෂයේදීද තවදුරටත් පැවතුණි. ඵලදායිත්වය තවදුරටත් ඉහළ නැංවීම හා රැකියා අවස්ථා ඇති කිරීම සඳහා නිදහස් වෙළඳපොළ අරමුණු කර ගත් කම්කරු නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම අවශ්‍යව ඇත. පුහුණු හා නුපුහුණු ශ්‍රම හිඟය වේගවත් කාර්මික වර්ධනයට බාධාවක් වෙමින් පවතී. විශේෂයෙන්ම රබර්, ප්ලාස්ටික්, ලෝහ, දුව සහ ආහාර සැකසීමේ කර්මාන්ත මගින් ඉවතලන අප ද්‍රව්‍ය මගින් සිදු වන පරිසර දූෂණයද දැඩි අවධානයට ලක් විය යුතු කරුණක් බවට පත් වී ඇත.

## 4.2 නිෂ්පාදනය

1999 වසරෙහි කාර්මික වර්ධනය ඇස්තමේන්තු කිරීම සඳහා ප්‍රධාන මූලයන් තුනක් පදනම් කොට ගෙන ඇත. ආයෝජන මණ්ඩලය යටතේ නොගැනෙන කාර්මික ව්‍යවසායයන් 475 ක් ආවරණය වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වන ලද 1999 වාර්ෂික කාර්මික නිෂ්පාදන සමීක්ෂණය, රාජ්‍ය අංශයෙහි කර්මාන්ත නිමැවුම සහ ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තවල අපනයන දත්ත මෙම මූලයන් වේ. මෙම ඇස්තමේන්තුව තුළ කම්හල් කර්මාන්ත නිමැවුම පමණක් අඩංගුව ඇති අතර තේ, රබර් සහ පොල් සැකසීම සහ කුඩා කර්මාන්ත යන අංශ දෙක ආවරණය වී නොමැත. මූර්ත වශයෙන් සියයට 4.5 කින්ද, නාමික වශයෙන් සියයට 8.0 කින්ද කාර්මික නිමැවුමෙහි වූ වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත අංශයේ ගම්‍ය මිල දර්ශකය සියයට 3.4 ක් විය.

කාර්මික නිමැවුමෙහි වර්ධනය ප්‍රධාන වශයෙන්ම රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන; ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන සහ සකස් කළ ලෝහ නිෂ්පාදන යන අංශ වලින් පිළිබිඹු විය. කාර්මික නිමැවුමෙහි වර්ධනයට මෙම කාණ්ඩ සියයට 95 කින් දායක විය.

### පෞද්ගලික අංශයේ කර්මාන්ත

1998 වසරෙහි වූ සියයට 6.9 හා සසඳන කළ 1999 දී පෞද්ගලික අංශයේ කර්මාන්ත සියයට 5.3 කින් වර්ධනය වූ අතර එය 1999 සමස්ත කාර්මික නිෂ්පාදනයෙන් සියයට 94 ක් විය. පසුගිය වසරෙහි වූ සියයට 6.4 ක වර්ධනය හා

**4.2 සංඛ්‍යා සටහන**
**පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන දර්ශකය**

1990=100

| කාණ්ඩය | දර්ශකය | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999(අ) | 1998 | 1999(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 155 | 166 | 171 | 188 | 193 | 9.7 | 2.7 |
| ආහාර සහ වෙනත් | 155 | 166 | 176 | 196 | 207 | 11.4 | 5.6 |
| මත්පැන් | 160 | 183 | 177 | 207 | 199 | 16.8 | -3.9 |
| පාන වර්ග | 175 | 180 | 207 | 226 | 221 | 9.3 | -2.2 |
| දුම්කොළ නිෂ්පාදිත | 128 | 135 | 121 | 121 | 118 | -0.2 | -2.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 206 | 217 | 257 | 269 | 289 | 4.5 | 7.4 |
| ඇඟළුම් | 223 | 235 | 284 | 297 | 322 | 4.7 | 8.4 |
| රෙදිපිළි | 171 | 174 | 191 | 199 | 198 | 4.3 | -0.5 |
| සම් භාණ්ඩ | 162 | 172 | 193 | 196 | 203 | 1.7 | 3.6 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 170 | 165 | 165 | 163 | 168 | -1.1 | 3.1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 266 | 279 | 287 | 289 | 286 | 0.8 | -1.0 |
| 5. රසායනික ද්‍රව්‍ය,ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 196 | 224 | 257 | 286 | 299 | 11.2 | 4.5 |
| රසායනික ද්‍රව්‍ය, තීන්ත වර්ග සහ පොහොර | 162 | 183 | 212 | 240 | 258 | 13.0 | 7.5 |
| රබර් | 181 | 213 | 253 | 274 | 279 | 8.3 | 1.8 |
| ප්ලාස්ටික් සහ පීවීසී | 161 | 182 | 210 | 227 | 252 | 8.2 | 11.0 |
| ඖෂධ, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත් | 204 | 235 | 265 | 297 | 312 | 12.1 | 5.1 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 228 | 243 | 254 | 267 | 288 | 5.1 | 7.9 |
| දියමන්ති සැකසීම | 280 | 270 | 260 | 237 | 274 | -8.8 | 15.6 |
| පිඟන් නිෂ්පාදන | 158 | 181 | 189 | 195 | 199 | 3.4 | 2.1 |
| සිමෙන්ති | 199 | 212 | 232 | 276 | 285 | 18.8 | 3.3 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් | 180 | 204 | 221 | 241 | 257 | 9.1 | 6.6 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 305 | 351 | 359 | 399 | 412 | 11.1 | 3.3 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 147 | 150 | 178 | 197 | 208 | 10.7 | 5.4 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 193 | 221 | 250 | 262 | 280 | 4.8 | 6.9 |
| සියළුම කාණ්ඩ | 192 | 205 | 230 | 246 | 259 | 6.9 | 5.3 |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සසඳන කල ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත සියයට 5.7 කින් වර්ධනය විය. 1998 වසරෙහි වූ සියයට 7.5 සමග සසඳන කල ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත අංශයේ නිමැවුම සියයට 5 කින් වර්ධනය විය.


1999 දී නිෂ්පාදන ධාරිතාවය වැඩි වුවද, ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්ත අංශයේ ධාරිතා උපයෝජනය 1998 දී වූ සියයට 84 සිට සියයට 83 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. 1998 දී සියයට 13.3 ක් වූ ලාභදායිත්වයද 1999 දී සියයට 12.2 දක්වා අඩු විය. කර්මාන්ත අංශයේ සමස්ත සේවා නියුක්තිය සියයට 9 කින් වැඩි විය. 1999 වසරේදී ආයෝජන මණ්ඩලයට අයත් හා අයත් නොවන කර්මාන්තයන්හි සේවා නියුක්තිය පිළිවෙළින් සියයට 11 කින් හා සියයට 2 කින් වැඩි විය.

## ප්‍රධාන කාර්මික නිෂ්පාදන අංශවල ක්‍රියාකාරිත්වය

### රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන

සමස්ත කාර්මික නිෂ්පාදනයෙන් සියයට 41 කට පමණ දායක වෙමින් රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩය 1999 දී සියයට 7.3 කින් වර්ධනය විය. පෙර වසරෙහි වූ සියයට 4.5 ක වර්ධනයට සාපේක්ෂව මෙය කැපී පෙනෙන වර්ධනයකි. අළුතින් ඇඟළුම් අපනයන කරන රටවල දැඩි අපනයන ප්‍රයත්නයන් හේතුවෙන් අඩු වට්නාකමින් යුත් අයිතම සඳහා වූ තරඟකාරිත්වය වසරේ මුල් කාලය තුළ නොකඩවා පැවතුණි. විශේෂයෙන්ම වසරේ දෙවන භාගයේදී ලෝක වෙළෙඳම යථා තත්ත්වයට පත් වීමත් සමග ප්‍රධාන පෙළේ අපනයන නිෂ්පාදකයින්ට උණුසුම් ඇඳුම් සඳහා ප්‍රමාණවත් අපනයන ඇණවුම් ලබා ගැනීමට හැකි විය. වැඩි වට්නාකමකින් යුත් අයිතම දෙසට ක්‍රමිකව

**4.2 රූප සටහන**
**කාර්මික නිෂ්පාදන වට්නාකම (1990-ස්ථාවර මිල අනුව)**




සිදුවන නැඹුරුව නිසා තරඟකාරී වෙළඳපොළවල් වෙතින් අපනයන ඇණවුම් ලබා ගැනීම පහසු විය. මෙම වෙළඳපොළවල් සඳහා අඩු වට්නාකමින් යුතු ඇඟළුම් සැපයීමේදී බංග්ලාදේශය, වියට්නාමය හා චීනය වැනි නිෂ්පාදන පිරිවැය අඩු රටවල් ප්‍රමුඛස්ථානය ගනු ලැබිය.

අඩු ක්‍රියාකාරිත්වයක් පවතින කාණ්ඩයන්හි පැවති උපයෝජනය නොකළ පංගු, පළමුව පැමිණෙන්නාට පළමුව දෙන පදනම යටතේ නිකුත් කිරීමට පංගු මණ්ඩලය ගත් තීරණයෙහි ප්‍රතිඵලයක් ලෙස වසරේ අග භාගයේදී පංගු උපයෝජන අනුපාතිකය ඉහළ ගියේය. 1998 සියයට 74 ක් වූ පංගු උපයෝජන අනුපාතිකය, 1999 දී සියයට 80 ක් දක්වා වැඩි විය. ලබා ගත හැකි වූ පංගු ප්‍රමාණය 1998 දී ඒකක දශ ලක්ෂ 327.7 ක් වූ අතර එය 1999 දී ඒකක දශ ලක්ෂ 388.3 දක්වා වැඩි විය. ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයන වීසා නිකුත් කිරීම සඳහා රෙදිපිළි පංගු මණ්ඩලය විසින් වසර තුළදී "විද්‍යුත් වීසා තොරතුරු ක්‍රමය" හඳුන්වා දෙනු ලැබිණ. මේ නිසා දත්ත සම්ප්‍රේෂණ වේගය සහ

**4.3 සංඛ්‍යා සටහන**
**කාර්මික නිෂ්පාදන වට්නාකම**
**(පවත්නා මිල ගණන් අනුව)**

| කාණ්ඩය | රුපියල් දශලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999(අ) | 1998 | 1999(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 54,927 | 68,209 | 75,713 | 86,994 | 94,687 | 14.9 | 8.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 104,602 | 117,539 | 146,500 | 165,443 | 178,844 | 12.9 | 8.1 |
| 3. දව හා දව නිෂ්පාදිත | 1,929 | 2,171 | 2,299 | 2,511 | 2,715 | 9.2 | 8.1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 4,595 | 5,069 | 5,462 | 5,593 | 5,854 | 2.4 | 4.7 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 38,321 | 46,936 | 50,682 | 59,724 | 62,590 | 17.8 | 4.8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 16,740 | 18,997 | 21,403 | 23,830 | 26,830 | 11.3 | 12.6 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,736 | 2,248 | 2,439 | 2,841 | 3,046 | 16.5 | 7.2 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 7,977 | 8,807 | 11,327 | 13,241 | 14,305 | 16.9 | 8.0 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5,271 | 6,183 | 7,324 | 8,137 | 9,002 | 11.1 | 10.6 |
| එකතුව | 236,098 | 276,159 | 323,149 | 368,314 | 397,873 | 14.0 | 8.0 |


(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

නිරවද්‍යතාවය වර්ධනය විය. එමෙන්ම අපනයන ලියකියවිලි සරලකිරීම, සම්ප්‍රේෂණ තොරතුරුවල විශ්වසනීයත්වය වර්ධනය වීම සහ ඇමෙරිකා එක්සත් ජනපදය තුළදී ආනයනික භාණ්ඩ ඉක්මණින් නිදහස් කර ගැනීමට හැකි වීම මෙමගින් සිදුවිය. 1998 දී රෙදිපිළි සඳහා ආනයන බදු ඉවත් කිරීම රේගු ප්‍රමාදයන් අඩු වීමට උපකාරී විය.

4.3 රූප සටහන

පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන ප්‍රමාණ දර්ශකය




1999 දී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ ඇඟළුම් හා රෙදිපිළි අපනයනවල ප්‍රමාණය වර්ග මීටර සමානුපාතික (ව.මී.ස.) දශ ලක්ෂ 560 ක් වූ අතර එය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1,470 ක වටිනාකමකින් යුක්ත විය. මෙය ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ගෙන් සියයට 2 ක් විය. 1999 දී ඇමෙරිකා එක්සත් ජනපදයට ශ්‍රී ලංකාව විසින් අපනයනය කරන ලද ඇඟළුම් ප්‍රමාණය සියයට 6.1 කින් වැඩි වූ අතර එහි වටිනාකම සියයට 1.2 කින් පහළ වැටීමෙන් මිල ගණන්වල සියයට 7.3 ක පහළ යාමක් පිළිබිඹු විය. 1999 දී ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළට අනෙකුත් රට වලින් කරනු ලැබූ රෙදිපිළි සහ ඇඟළුම් අපනයන මිල ගණන් සියයට 4.9 කින් පහත වැටුණි. 1998 දී ශ්‍රී ලංකාව ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළට කරනු ලැබූ ඇඟළුම් අපනයන ප්‍රමාණය ව.මී.ස. දශ ලක්ෂ 337.2 ක් වූ අතර එය 1999 දී ව.මී.ස. දශ ලක්ෂ 332.5 දක්වා සියයට 1.4 කින් වර්ධනය විය. මෙයින් සියයට 76 ක් පංගු ක්‍රමය යටතේ අපනයනය කර ඇත. 1999 දී පංගු අපනයන අයිතම සියයට 1 කින් අඩු වූ අතර පංගු නොවන ඇඟළුම් අයිතම සියයට 9.4 කින් වැඩි විය. 1998 දී ඇමෙරිකා එක්සත් ජනපදයට කරන ලද අනෙකුත් වර්ගවල රෙදිපිළි අපනයන ව.මී.ස. දශ ලක්ෂ 195.2 ක් වූ අතර එය 1999 දී ව.මී.ස. දශ ලක්ෂ 223 දක්වා සියයට 14.2 කින් ඉහළ ගියේය. මින් සියයට 94 ක් පංගු නොවන අපනයන් විය.

1999 දී ලබාගත හැකි වූ සමස්ත පංගු ප්‍රමාණය සියයට 4.2 කින් වැඩි විය. ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළෙහි පංගු ප්‍රමාණය සියයට 3.8 කින්ද, යුරෝපා සංගමයේ රටවල පංගු ප්‍රමාණය සියයට 7.3 කින් සහ කැනඩාවේ පංගු ප්‍රමාණය සියයට 1 කින්ද වැඩි විය. දනට ශ්‍රී ලංකාව මෙම වෙළෙඳපොළවල් සඳහා පංගු ක්‍රමය යටතේ විවිධ වර්ගවල ඇඟළුම් හා රෙදිපිළි අයිතම 50 ක් පමණ අපනයනය කරනු ලැබේ. ඇමෙරිකා එක්සත් ජනපද වෙළඳපළ තුළ කබා, ඇඳුම් කට්ටල් නොවන ඇඳුම්, ගොතන ලද කමිස සහ හැට්ට, සාය, ආවරණ කබා සහ අත් පිස්නා, සන කමිස, පොප්ලින් රෙදි, නොගෙතූ කමිස සහ හැට්ට වැනි කාණ්ඩ සඳහා පැවති පංගු ප්‍රමාණය සියයට 10 කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. දිග කලිසම්, කොට කලිසම් සහ විවිධ වර්ගයේ උණුසුම් ඇඳුම් යන කාණ්ඩ සඳහා යුරෝපා සංගමයේ රටවලින් ලැබුණු පංගු ප්‍රමාණය 1999 දී සියයට 15 කින් වැඩි විය. කෙසේ වුවද, පෙර වසරෙහි වූ අඩු උපයෝජනය නිසා පිරිමි සහ පිරිමි ළමුන්ගේ වියන ලද කමිස සඳහා වූ පංගු ප්‍රමාණය 1999 දී සියයට 13 කින් අඩු විය. කැනඩාවෙන් ලැබුණු හිම කබා පංගු ප්‍රමාණය සියයට 54 කින් වැඩි වුවද අනෙකුත් පංගු ප්‍රමාණයන් නොවෙනස්ව පැවතිණ.

පිරිමි සහ පිරිමි ළමුන්ගේ ඇඳුම් කට්ටල් නොවන කබා සහ පිරිමි හා පිරිමි ළමුන්ගේ ඇඳුම් කට්ටල් වැනි ඉහළ වටිනාකමක් ඇති අයිතම සඳහා පැවති ඉහළ පංගු උපයෝජන නැඹුරුව 1999 වසරේද අඛණ්ඩව පැවතින. 1998 දී එක්සත් ජනපද වෙළෙඳපොළෙහි සියයට 78 ක්වූ පංගු උපයෝජන අනුපාතය 1999 දී සියයට 85 දක්වා වැඩි විය. 1999 වසර තුළදී පංගු අයිතම 13 කට ආසන්න ප්‍රමාණයක් සියයට 85 කට වඩා වැඩි උපයෝජන අනුපාතයක් පෙන්විය. එක්සත් ජනපද වෙළෙඳපොළෙහි සාය, දිග කලිසම් සහ ගවුම් සඳහා වූ පංගු ප්‍රමාණය වසර තුළදී මුළුමණින්ම උපයෝජනය කළ අතර ගොතන ලද කමිස සහ හැට්ට, කමිස සහ ගවුම් (නොගෙතූ), අනෙකුත් සිනිඳු තුවා සහ සාප්පු තුවා වැනි අයිතමයන්හි පංගු උපයෝජනය සියයට 90 කට වඩා වැඩි විය. යුරෝපා වෙළෙඳපොළෙහි පිරිමි සහ ගැහැණු දිග කලිසම්, පිරිමි කොට කලිසම් සහ ගොතන ලද සහ වියන ලද හැට්ට යන පංගු අයිතම සඳහා වූ උපයෝජන අනුපාතය ඉහළ මට්ටමක පැවතින. කෙසේ වුවද, වියන ලද විවිධ වර්ගයේ උණුසුම් ඇඳුම් සඳහා වූ පංගු උපයෝජන අනුපාතය සියයට 30 කට අඩු මට්ටමක පැවතින. නිෂ්පාදකයින්ට අවශ්‍ය කරන ගුණාත්මක තත්ත්වයෙන් සැපයීමට නොහැකි වීම නිසා කබා, හැට්ට සහ වැහි කබා, සිනිඳු ඇඳුම්, ටීෂර්ට්, ක්‍රීඩා ඇඳුම්, නිදන ඇඳුම්, නාන ඇඳුම් හා පිහිනුම් ඇඳුම් සඳහා වූ පංගු උපයෝජනය සියයට 25 කට වඩා අඩු මට්ටමක පැවතින.

නැගෙනහිර යුරෝපීය ආර්ථිකයන් විවෘත වීම, ඇඟළුම් කර්මාන්තයට අළුතින් එකතු වූ රටවල් විසින් කරනු ලැබූ අපනයන ඉහළ යාම, අපනයන බහුවිධ කෙදි ගිවිසුම අහෝසි වීම සහ කලාපීය වෙළඳම් වර්ධනය වීමේ තත්ත්වයන් තුළ ශ්‍රී ලංකාවේ අපනයන සඳහා තරඟකාරීත්වය තවදුරටත් වර්ධනය වනු ඇත. විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයට කරන අපනයන සම්බන්ධයෙන් මෙක්සිකෝවෙන් දැඩි තරඟකාරීත්වයක් එල්ල විය හැකි අතර, භූගෝලීය

වශයෙන් එක්සත් ජනපද වෙළඳපොළට ආසන්නව පිහිටීම, අඩු ශ්‍රම පිරිවැය සහ උතුරු අත්ලාන්තික් නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පිරිනමණු ලබන වාසිදායක බදු මේ සඳහා හේතු වනු ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයට කෙරෙන අඩු වටිනාකමක් සහිත ශ්‍රී ලංකා ඇඟළුම් අපනයනවලට ඇඟළුම් කර්මාන්තයට අළුතින් එක් වූ රටවලින් තර්ජන එල්ල වේ. එබැවින් පංගු ඇඟළුම් අපනයන වලින් ඉවත්වී ඉහළ වටිනාකමක් සහිත කුඩා වෙළෙඳපොළ අත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. මේ සඳහා නව තාක්‍ෂණය හඳුන්වා දීම, තොරතුරු තාක්‍ෂණය දියුණු කිරීම, විද්‍යුත් වාණිජ ක්‍රම පරිහරණය දියුණු කිරීම, ගැණුම් කරුවන් සමග පංගු නොවන අපනයන අයිතම සම්බන්ධව වෙළෙඳ සම්බන්ධතා වර්ධනය කිරීම සහ අපනයන ඇණවුම් නියමිත කාලයේදී භාර දීම අවශ්‍ය වනු ඇත. වෙනස් වෙමින් පවතින මෙම ලෝක වෙළෙඳපොළ තත්ත්වයන්ට ක්‍ෂණිකව ප්‍රතික්‍රියා දක්වීමේ හැකියාව ඇත්නම් ශ්‍රී ලංකා ඇඟළුම් අපනයන කර්මාන්තයට අනාගතයේදී ඉහළ වර්ධනයක් අත් කර ගැනීමට හැකි වනු ඇත.

ආනයන මගින් එල්ල වන තරඟකාරී තත්ත්වයට මුහුණ දිය හැකි වන පරිදි රෙදිපිළි කර්මාන්තය මුළුමණින්ම යථා තත්ත්වයට පත් වී නොමැත. රෙදිපිළි කර්මාන්තයට ආවේණික ප්‍රධාන ගැටළු වූ පැරණි යන්ත්‍රසූත්‍ර භාවිතය, ඉහළ නිෂ්පාදන පිරිවැය සහ නිෂ්පාදනයන්ගේ අඩු ගුණාත්මක භාවයට අමතරව නිදහස් රෙදිපිළි ආනයනය සහ ආසියාතු මුදල් අවප්‍රමාණ වීමෙන් පසු ලෝක වෙළඳපොළෙහි රෙදිපිළි මිල අඩු වීමද, මෙම කර්මාන්තය මුහුණ දුන් දුෂ්කරතා වඩාත් තීව්‍ර කිරීමට හේතු විය. කෙසේ වුවද, රෙදිපිළි කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ව්‍යවසායයන් 98 ක් සිය කම්මල් නවීකරණය කිරීමේ යෝජනා ඉදිරිපත් කර තිබුණි. ඉන් ව්‍යවසායයන් 73 ක් සිය නවීකරණ යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සඳහා බැංකු තහවුරුව ලබාගෙන තිබුණි. නිෂ්පාදකයන් 25 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් තම ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘති දනටමත් ආරම්භ කර ඇත.

දේශීය ඉල්ලුම වැඩි වීම මෙන්ම අපනයන පුළුල් වීම හේතුවෙන් පාවහන් කර්මාන්තයේ නිමැවුම 1999 දී සියයට 3.5 කින් වැඩි විය. වසර තුළදී නිෂ්පාදකයින් දේශීය වෙළෙඳපොළ සඳහා සිත් ගන්නා සුළු මෝස්තර හඳුන්වා දුන් අතර වෙළෙඳපොළෙහි ආනයනිත නිෂ්පාදන පවතිද්දීත් පාරිභෝගිකයන් මෙම නිෂ්පාදන සඳහා බලවත් කැමැත්තක් දක්වූහ. ඇමෙරිකා එක්සත් ජනපදය හා මැද පෙරදිග රට වලින් ලැබුණු ඇණවුම් වැඩි වීම හේතුවෙන් පාවහන් අපනයනය පුළුල් විය.

## ආහාර පාන වර්ග සහ දුම්කොළ

කර්මාන්ත අංශයේ දෙවන විශාලතම උපකාණ්ඩය වන ආහාර පාන වර්ග සහ දුම්කොළ කර්මාන්තයන්හි නිමැවුම සියයට 2.4 කින් වැඩි විය. 1999 කර්මාන්ත අංශයේ සමස්ත වර්ධනයට මෙම කාණ්ඩය සියයට 12 කින් දායක විය. ආහාර උප අංශය සියයට 5.7 කින් වර්ධනය වූ අතර මත්පැන් නිෂ්පාදනය සියයට 2.4 කින්ද, සිසිල් බීම සියයට 3.8 කින් හා දුම්කොළ නිෂ්පාදිත සියයට 2.5 කින් ද අඩු විය. තිරිඟු පිටි, කිරි නිෂ්පාදන, පළතුරු සැකසීම, බිස්කට්, අසුරන ලද තේ, පොල් නිෂ්පාදන, සීනි, බීර සහ මස් නිෂ්පාදනවල නිමැවුමෙහි වැඩි වීමක් දක්නට ලැබුණි. සකස් කළ මස් නිෂ්පාදන කර්මාන්තය 1999 දී සියයට 11 කින් වර්ධනය විය. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නව තාක්‍ෂණය හඳුන්වා දීමෙන් නිෂ්පාදකයන්ට විවිධ වර්ගයේ නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට හැකි විය. මාළු සැපයුම ප්‍රමාණවත් නොවීමත්, මිල ගණන් අධික වීමත් හේතුවෙන් 1999 දී මෙම නව නිෂ්පාදන සඳහා සැළකිය යුතු ඉල්ලුමක් තිබුණි. සැකසූ මස් නිෂ්පාදන නාගරික ජනතාව තුළ ජනප්‍රිය වීම, සිත් ගන්නා සුළු ඇසුරුම්, ප්‍රචාරණය සහ පිළියෙල කර ගැනීමේ පහසුව මෙම නිෂ්පාදන සඳහා ඉහළ මට්ටමක ඉල්ලුමක් පැවතීමට හේතු විය. ආහාර රටාව වෙනස් වීම, නාගරික ජනගහණයෙහි ක්‍රමික වර්ධනය සහ කුඩා ප්‍රමාණයේ පැකට්ටු හඳුන්වා දීම 1999 දී බිස්කට් සඳහා වූ ඉල්ලුම වර්ධනය වීමට හේතු විය. රජය මගින් ලබා දුන් දිරි ගැන්වීම් වලින් දිරිමත් වූ අපනයනාභිමුඛ පළතුරු සැකසීමේ කර්මාන්තය එම නිෂ්පාදන සඳහා පවතින ඉහළ යන ජාත්‍යන්තර ඉල්ලුම සපුරාලනු වස් උසස් තාක්‍ෂණය හා කම්හල් නවීකරණය සඳහා ආයෝජනය කළහ. කෙසේ වුවද, වෙළෙඳ බෝග වගාවන් සඳහා සුදුසු ඉඩම් නොතිබීමත්, උසස් තත්ත්වයේ බීජ නොතිබීමත් මෙම කර්මාන්තයේ දියුණුවට තවමත් බාධකයක්ව පවතී.

වසර තුළදී කිරි පිටි ඇසුරුම් සහ නිෂ්පාදන කර්මාන්තය සියයට 4.0 කින් වැඩි විය. ආනයනික කිරි නිෂ්පාදන මිල ගණන්වලට සාපේක්‍ෂව පවතින ආකර්ශණීය මිල ගණන් හා නිෂ්පාදන තත්ත්වය ඉහළ යාම නිසා දේශීය වශයෙන් නිෂ්පාදිත කිරි පිටි සඳහා වූ ඉල්ලුම ඉහළ ගියේය. දනට මුළු කිරි පිටි අවශ්‍යතාවයෙන් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් ආනයනය කරනු ලබන හෙයින් මෙම කර්මාන්තයට විශාල වශයෙන් වර්ධනය වීමේ ඉඩ ප්‍රස්තා ඇත. 1998 මත්පැන් සහ සුරා බදු වැඩි කර තිබියදීත් මෑතදී වූ ධාරිතා පුළුල් වීමෙන් හා ඉහළ දේශීය ඉල්ලුම හේතුවෙන් බීර නිෂ්පාදනය තවදුරටත් වර්ධනය විය. සංචාරක කර්මාන්තයෙහි වර්ධනයද බීර සඳහා වූ ඉල්ලුම ඉහළ යාමට දායක විය. වෙළඳපොළට අළුතින් හඳුන්වා දුන් නව නිෂ්පාදන කෙරෙහි පාරිභෝගිකයින් දැඩි කැමැත්තක් දක්වූහ. මෙම කර්මාන්තයේ නියුතු ප්‍රධාන පෙළේ නිෂ්පාදකයින් ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා උසස් තාක්‍ෂණය හා යන්ත්‍රාගාර නැවත ස්ථානගත කිරීමට විශාල වශයෙන් මුදල් ආයෝජනය කළහ. අනෙකුත් රටවල් හා සසඳන කල ශ්‍රී ලංකාවේ මුළු මත්පැන් පරිභෝජනයෙන් බීර පරිභෝජනය බෙහෙවින් අඩු මට්ටමක පවතින බැවින් මෙම කර්මාන්තයට අනාගතයේදී වර්ධනය වීමේ ශක්‍යතාවයක් පවතී. මෑතදී මිල ගණන් ඉහළ යාම මෙන්ම නීති විරෝධී මත්පැන් බහුල වීම නිසා 1999 දී මත්පැන් ස්ප්‍රීතු නිෂ්පාදනය පහත වැටුණි.

වැසි සහිත කාලගුණික තත්ත්වය හේතුවෙන් සිසිල් බීම සඳහා වූ ඉල්ලුම පහළ යාම නිසා පාන වර්ග උප

අංශයයෙහි නිෂ්පාදිතය පහත වැටුණි. මෑතදී දුම්කොළ මත පනවන ලද බදු ඉහළ යාම සහ ආනයනික සිගරට් වර්ග වැඩි වීම හේතුවෙන් සිගරට් නිෂ්පාදනය, විශේෂයෙන්ම, අඩු වටිනාකමින් යුත් සිගරට් නිෂ්පාදනය අඩු විය. විශේෂයෙන්ම තරුණයන් අතර දුම්කොළ හා සම්බන්ධ සෞඛ්‍ය ගැටළු පිළිබඳ ඉහළ මට්ටමක අවබෝධයක් පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස මෑත භාගයේදී පොදුවේ සිගරට් සඳහා වූ ඉල්ලුම අඩු වීමේ හෝ නොවෙනස්ව පැවතීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබුණි.

## රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත

1999 දී රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය සියයට 4.6 කින් ඉහළ ගියේය. දේශීය වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කරනු ලබන සබන්, සුවඳ විලවුන්, දන්තාලේප, සනීපාරක්‍ෂක ද්‍රව්‍ය, ඖෂධ, තීන්ත, වාර්නිෂ්, පොහොර, පොලිතින් මලු, රබර් ටයර් සහ ටියුබ්, අලවන ද්‍රව්‍ය, ප්ලාස්ටික් නිෂ්පාදන, පී.වී.සී. නිෂ්පාදන, ආයුර්වේද ඖෂධ සහ පොලිතින් වැනි කර්මාන්තයන්හි නිමැවුමෙහි ඉහළ වර්ධනයක් දක්නට ලැබුණි. මෙම ඉහළ වර්ධනයට සාධක වූ කරුණු වූයේ බෙදා හැරීම් ජාලය සවිමත් කිරීම, සිත් ගන්නා සුළු ඇසුරුම් සහ අමු ද්‍රව්‍ය මිල ගණන් අඩු වීමය. ආනයන හා සැසඳීමේදී තරඟකාරී මිල ගණන් පැවැති නිසා ඖෂධ නිමැවුමෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය. වසර ගණනාවක් තිස්සේ නිෂ්පාදන තත්ත්වයන් ඉහළ යාමද ඉල්ලුම වැඩි වීම සඳහා උපකාරී විය. ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයෝ සිය නිෂ්පාදන තාක්‍ෂණය, නිෂ්පාදනවල තත්ත්වය හා ඇසුරුම්වල තත්ත්වය වැඩි දියුණු කළහ. වසර තුළදී ඔව්හු නව නිෂ්පාදන කිහිපයක් හඳුන්වා දුන්හ. විශේෂයෙන්ම නාගරික ජනතාව ස්වභාවික නිෂ්පාදන සඳහා වැඩි කැමැත්තක් දක්වීම ආයුර්වේද ඖෂධ සඳහා ඇති ඉල්ලුම ඉහළ යාමට හේතු විය.

වැඩි වන දේශීය ඉල්ලුම හේතුවෙන් පෙර වසරේදී මෙන්ම ප්ලාස්ටික් කර්මාන්තයෙහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. දැව නිෂ්පාදන වෙනුවට ප්ලාස්ටික් නිෂ්පාදන ආදේශ කිරීම, ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ, සිවිලින් තහඩු, අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඇසිරීම සඳහා වූ පෙට්ටි නිෂ්පාදනවල වැඩි වීමට හේතු විය. ඉදි කිරීම් කර්මාන්තයෙන් ඇතිවූ ඉහළ ඉල්ලුම හේතුවෙන් පීවීසී සහ එම උපාංග නිමැවුම වර්ධනය විය. ආනයනික භාණ්ඩ වැඩි වශයෙන් වෙළෙඳපොළෙහි තිබියදීත් මිල අඩු වීම නිසා දේශීය වෙළඳපොළ අරමුණු කරගෙන නිපදවෙන රබර් ටයර් සහ ටියුබ් නිෂ්පාදනවල නිමැවුමෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය. පසුගිය වසර දෙක තුළ දුෂ්කරතාවලට මුහුණ දුන් අපනයන පෙරදැරි කර ගත් සක්‍රීය කාබන් නිෂ්පාදන කර්මාන්තය, දැඩි තරඟකාරිත්වය නිසා තවදුරටත් පහත වැටුණි. වසර තුළ ඇමරිකා එක්සත් ජනපදය වැනි ප්‍රධාන වෙළඳපොළ සඳහා වූ නැව් ගාස්තු ඉහළ යාම මෙම කර්මාන්තය මුහුණ දුන් ගැටළු වඩාත් තීව්‍ර වීමට හේතු විය.

## අනෙකුත් නිෂ්පාදන

1999 කර්මාන්ත අංශයේ වර්ධනයට සියයට 14 කින් දයක වූ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩය සියයට 7.9 කින් වර්ධනය විය. 1999 දී සකස් කළ දියමන්ති, සිමෙන්ති, ඇස්බැස්ටෝස්, වීදුරු සහ කොන්ක්‍රීට් නිෂ්පාදන නිමැවුමෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය. වසරේ දෙවන භාගය තුළ දී ලෝක වෙළෙඳම යථා තත්ත්වයට පත් වීමත් සමගම දියමන්ති සකස් කිරීමේ කර්මාන්තයෙහි සියයට 15.2 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරිණ. ජපානය, තායිලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය, හොංකොං සහ බෙල්ජියම යන රට වලින් මෙම නිෂ්පාදකයන්ට වැඩි අපනයන ඇණවුම් ප්‍රමාණයක් ලැබුණි. ඉදි කිරීමේ කර්මාන්තයේ අඛණ්ඩ ප්‍රසාරණය, ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු, සිවිලිම් තහඩු, කොන්ක්‍රීට් හා බිමට අතුරණ පිඟන් ගඩොල් නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම වර්ධනය වීමට හේතු විය. සකස් කළ තිරුවාණ කැට, ඔප දැමූ බිමට අතුරණ කලු ගල් නිෂ්පාදනයද 1999 දී ඉහළ වර්ධනයක් වාර්තා කළේය. නිෂ්පාදනයෙහි උසස් තත්ත්වය හේතුවෙන්, ලෝක වෙළෙඳපොළෙහි දැඩි තරඟකාරිත්වයක් තිබියදීත් ඇතැම් පිඟන් භාණ්ඩ සඳහා අළුතින් වෙළෙඳපොලවල් ලබා ගත හැකි විය. ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම වැඩි වීම, පිඟන් ගඩොල් භාවිතයේ ජනප්‍රියතාව ඉහළ යාම බිත්ති සහ පොලොවට අතුරන පිඟන් ගඩොල් සඳහා වූ දේශීය ඉල්ලුම වැඩි වීමට හේතු විය. ආයෝජන මණ්ඩලය සමග පැවැති ගිවිසුම යටතේ දේශීය අලෙවිය සීමා වී තිබූ බැවින් දේශීය වෙළෙඳපොළට කරන අලෙවිය වැඩි කර ගැනිමට අවශ්‍ය වූ සමහර ආයෝජන මණ්ඩලයට අයත් නිෂ්පාදකයින් සිය කර්මාන්ත ආයෝජන මණ්ඩල තත්ත්වයෙන් ඉවත් කරගත්හ. මෑත කාලයේදී නවීන පරිපාලන ක්‍රම වේදයන් හා නවීන යන්ත්‍රසූත්‍ර හඳුන්වා දීමත් සමහම මෙම කර්මාන්තවල ඵලදායීතාවය කැපී පෙනෙන ලෙස වැඩි වී ඇත. කෙසේ වුවද, මෙම කර්මාන්තය සඳහා අත්‍යාවශ්‍ය අමු ද්‍රව්‍යයක් වන පිඟන් මැටි තොග හිඟවීම දිගුකාලීන වශයෙන් පිඟන් කර්මාන්තයට මුහුණ දීමට සිදුවන ප්‍රධාන ගැටළුවක් වනු ඇත.

දේශීය වෙළෙඳපොළ සඳහා නිපදවෙන ලෝහ නිෂ්පාදන කර්මාන්තයන්හි වඩාත් හොඳ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරමින් සකස් කළ ලෝහ නිෂ්පාදන සියයට 5.4 කින් වර්ධනය විය. මෙම අංශයෙහි ප්‍රධාන නිෂ්පාදන වූයේ විද්‍යුත් සහ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, විදුලි රැහැන්, ලෝහමය ගෘහ භාණ්ඩ, ලිපිගොනු රාක්ක, කාර්යාලීය කැබිනට්ටු, සූර්ය බලශක්ති උත්පාදන, රැලි සහිත ලෝහ සෙවිලි තහඩු, බඳුන්, රථ වාහන බැටරි, විදුලි පහන් ආවරණ, විදුලි පරිනාමක (ට්‍රාන්ෆෝමර්ස්), ඇන්ටෙනා, ග්‍රාහක උපාංග සහ මුළුතැන්ගෙයි සෝදන බේසම් වේ. දැව ගෘහ භාණ්ඩ වලින් ලෝහමය ගෘහ භාණ්ඩවලට මාරු වීමේ හේතුවෙන් ලෝහමය කාර්යාලයීය හා ගෘහ භාණ්ඩ සඳහා වූ ඉල්ලුමෙහි සැළකිය යුතු වර්ධනයක් 1999 දී වාර්තා විය. රූපවාහිනී යන්ත්‍ර වේගයෙන් ජනප්‍රිය වීම ඇන්ටෙනා සහ ග්‍රාහක උපකරණ සඳහා වූ ඉල්ලුම වැඩි

වීමට හේතු විය. ඉදි කිරීම් කර්මාන්තයේදී ජනේල, දොර රාමු සහ වෙන් කිරීම් සඳහා දැව වෙනුවට ඇලුමිනියම් භාවිතයට මාරු වීමක් සිදු වී ඇත. අඩු මිල ගණන්, සිත් ගන්නා සුළු පෙනුම හා කල් පවත්නා බව මෙයට ප්‍රධාන හේතු විය. ඉදි කිරීම් කර්මාන්තයේ අඛණ්ඩ ප්‍රසාරණය, විදුලිය සැපයීමේ උපාංග සහ විදුලි රැහැන් සඳහා වූ ඉල්ලුම ඉහළ යාමට හේතු විය. නැව් තැනීම හා නඩත්තු කටයුතු කර්මාන්තය වසර ගණනාවක් තුළ තාක්ෂණික හා පුහුණු ශ්‍රමය වැනි යටිතල පහසුකම් වැඩි දියුණු කරගෙන ඇත. කෙසේ වුවද, රජයේ ඇණවුම් අඩු වීම හේතුවෙන් 1999 වසර තුළ මෙම කර්මාන්තයේ නිමැවුම වැඩි වූයේ සුළු වශයෙනි. ආනයනිත බැටරි බහුලව තිබියදීත් දේශීය ඉල්ලුමෙහි පුළුල් වීමක් පෙන්නුම් කරමින් රථ වාහන බැටරි නිෂ්පාදනයෙහි කැපී පෙනෙන ඉහළ යාමක් දැකිය හැකි විය.

රැලි සහිත කඩදාසි පෙට්ටි හා මුද්‍රණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි නිමැවුමෙහි අඩු වීම හේතුවෙන් කඩදාසි හා කඩදාසි නිෂ්පාදන කර්මාන්තය සියයට 1 කින් පහත වැටිනි. පුවත්පත්, සඟරා, ළමා පොත් සහ සිතියම්, පරිගණක සඳහා භාවිතා වන කඩදාසි, දින පොත්, දැන්වීම් පත්‍රිකා සහ දින දර්ශන සඳහා වූ ඉල්ලුම පුළුල් වීම හේතුවෙන් දේශීය වෙළෙඳපොළ අරමුණු කරගෙන කඩදාසි නිෂ්පාදන කර්මාන්තය සියයට 5.5 කින් වර්ධනය විය. 1998 දී වූ සියයට 2 ක වර්ධනය හා සැසඳීමේදී, පුවත්පත් බෙදා හැරීම 1999 දී සියයට 5 කින් ඉහළ ගියේය. වසර තුළදී අළුත් සඟරා සහ තීරු පුවත්පත් කිහිපයක් ප්‍රකාශයට පත් විය. පාසැල් ළමුන්ගේ කියවීමේ පුරුද්ද වැඩි වීමත්, පාසැල් විෂයධාරාවන්ට අතිරේක කියවීම් පොත් ඇතුළත් කිරීමත්, ළමා පොත් මුද්‍රණය සඳහා වූ ඉල්ලුම දිරි ගැන්වීය. ව්‍යාපාරික ආයතන විශාල සංඛ්‍යාවක් නව සහස්‍රයේ උදාව සැමරීම සඳහා දින දර්ශන සහ දින පොත් ත්‍යාග කිරීම දින පොත් හා දින දර්ශන සඳහා වූ ඉල්ලුම වැඩි වීමට හේතු විය. ප්‍රචාරණය සඳහා දැන්වීම් පත්‍රිකා භාවිතය ජනප්‍රිය වීම මෙම නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම ඉහළ යාමට හේතු විය. වෙළඳපොළෙහි ආනයනිත ආදේශක භාණ්ඩ තිබියදීත් දේශීය නිමැවුම් වල ගුණාත්මක භාවය ඉහළ යාම හේතුවෙන් අභ්‍යාස පොත් නිෂ්පාදනයේ සාමාන්‍ය වර්ධනයක් වසර තුළදී වාර්තා විය. අපනයනාභිමුඛ මෙන්ම දේශීය වෙළඳපොළ සඳහා නිෂ්පාදිත දැව හා දැව භාණ්ඩ කර්මාන්තයෙහි වැඩි වීමක් පිළිබිඹු කරමින් 1999 දී එම කර්මාන්තයෙහි සියයට 3.3 ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා විය. 1999 අවසානය දක්වා ආනයනිත දැව සඳහා වූ තීරු බදු ඉවත් කිරීම ගෘහ භාණ්ඩ සහ අනෙකුත් දැව භාණ්ඩ කර්මාන්තයට වාසිදායක විය. වසර තුළදී දැව හා ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුතු ඇතැම් කර්මාන්තකරුවන් නව යන්ත්‍ර සූත්‍ර සවි කළහ. කෙසේ වුවද, අමු ද්‍රව්‍ය සැපයුම අඩු වීම සහ මිල ඉහළ යාම, පුහුණු ශ්‍රම හිඟය හා දැවමය ගෘහ භාණ්ඩ සඳහා වූ පාරිභෝගික ඉල්ලුම වානේ, ප්ලාස්ටික්, ෆයිබර් ග්ලාස් ආශ්‍රිත ගෘහ භාණ්ඩ සඳහා මාරු වීම, දැව හා ගෘහ භාණ්ඩ කර්මාන්තයෙහි වේගවත් වර්ධනයට බාධා පැමිණවීය.

## රාජ්‍ය අංශයෙහි කර්මාන්ත

1998 දී සියයට 14 ක් වූ වර්ධනයට වෙනස්ව යමින් රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙහි මූර්ත වටිනාකම 1999 දී සියයට 12 කින් අඩු විය. වසර දෙකකට වරක් සිදු කෙරෙන නඩත්තු කටයුතු සඳහා වසරේ මුල් මාස දෙකක පමණ කාලයක් තුළ තෙල් පිරිපහදුව වසා තිබීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි නිමැවුම අඩු වීම මෙම පහත වැටීමට මූලික හේතුව විය. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි නිමැවුම රාජ්‍ය අංශයේ සමස්ත කාර්මික නිමැවුමෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයකට දායක වේ. ඛනිජ තෙල් නිෂ්පාදිත හැරුණුවිට ද රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 26 කින් පහත වැටීමට හේතු වූයේ සීමාසහිත රාජ්‍ය රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව (සියයට 78), සීමාසහිත ජාතික කඩදාසි සමාගම (සියයට 47), සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (සියයට 17) සහ සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය (සියයට 2) යන ආයතනවල නිමැවුමෙහි අඩු වීමයි.

**4.4 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය**


1977=100

| කාණ්ඩය | දර්ශකය | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999 (අ) | 1998 | 1999 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 10.2 | 9.2 | 8.6 | 8.3 | 9.2 | -3.5 | 10.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | - | - | - | - | - | - | - |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 26.3 | 31.7 | 34.0 | 45.1 | 46.9 | 32.6 | 4.0 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 173.2 | 152.2 | 136.2 | 100.7 | 54.9 | -26.1 | -45.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 118.0 | 132.0 | 116.8 | 136.4 | 120.5 | 16.8 | -11.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 124.2 | 138.9 | 122.8 | 143.5 | 126.9 | 16.9 | -11.6 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 5.9 | 6.8 | 4.7 | 6.0 | 3.7 | 29.0 | -38.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 95.0 | 116.5 | - | - | - | - | - |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - | - |
| සියළුම කාණ්ඩ | 78.0 | 86.2 | 72.2 | 82.5 | 72.3 | 14.3 | -12.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 24.5 | 25.1 | 13.5 | 11.6 | 8.7 | -13.9 | -25.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

4.4 රූප සටහන
කාර්මික නිෂ්පාදනය තුළ පෞද්ගලික හා රාජ්‍ය අංශය සතු කොටස





වසරේ වැඩි කාලයක් තුළ යහපත් කාලගුණයක් පැවතීම හේතුවෙන් සීමාසහිත ලංකා ලුණු සමාගමෙහි නිමැවුම 1999 දී කැපී පෙනෙන ලෙස සියයට 86 කින් වර්ධනය විය. වෙළෙඳපොළෙහි තරඟකාරි නිෂ්පාදිත සමග පැවති වාසිදායී මිළ ගණන්, සිත් ගන්නා සුළු ඇසුරුම් හා වසර ගණනාවක් තිස්සේ අත් කර ගත් උසස් නිෂ්පාදන තත්ත්වයන් සීමාසහිත ලංකා ලුණු සමාගමේ වෙළඳපොළ කොටස ඉහල නංවා ගැනීමට උපකාරී විය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දව කැපීම සඳහා වැඩි වන ප්‍රදේශයක් වෙන් කර දීමේ හේතුවෙන් රාජ්‍ය දව සංස්ථාවෙහි නිමැවුම සියයට 4 කින් වර්ධනය විය. සංස්ථාව මගින් නිෂ්පාදිත ලී බඩු හා දෙර හා ජනෙල් රාමු වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය නිමැවුම වසර තුළදී රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථා වලින් වූ ඉහළ ඉල්ලුම නිසා වැඩි විය.

දනට ක්‍රියාත්මක වෙමින් පවතින නවීකරණ වැඩසටහන යටතේ යන්ත්‍රසූත්‍ර සවි කිරීම සඳහා නිෂ්පාදන අත්හිටුවීම හේතුවෙන් ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවෙහි නිමැවුම පහත වැටුණි. ඉල්ලුම අඩු වීම හා නිෂ්පාදන වියදම ඉහළ යාම හේතුවෙන් සංස්ථාව ක්‍රේප් රබර් නිෂ්පාදනය 1999 ජූලි සිට නතර කර ඇත. නවීකරණ වැඩසටහන යටතේ රබර් ආශ්‍රිත අවසාන නිෂ්පාදන සඳහා දනට පවතින නිෂ්පාදන ක්‍රියාවලිය පරිවර්තනය කර ඇත. යල් පැන ගිය නිෂ්පාදන ක්‍රම හේතුවෙන් අවසාන නිෂ්පාදනයන්ගේ තත්ත්වය පහළ යාම, ඉහළ නිෂ්පාදන පිරිවැය හා ආනයනිත භාණ්ඩ වලින් වූ දැඩි තරඟකාරිත්වය හමුවේ ජාතික කඩදසි සංස්ථාවට අලෙවි දුෂ්කරතාවලට මුහුණපෑමට සිදු විය. වසරේ මුල් භාගයේදී පොස්පේට් සඳහා වැවිලි අංශයෙන් වූ ඉල්ලුම අඩු වීම 1999 දී සීමාසහිත ලංකා පොස්පේට් සමාගමෙහි නිමැවුම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. උක් දඬු සැපයුමෙහි අඩු වීම නිසා සීමාසහිත සෙවනගල සීනි කර්මාන්ත ආයතනයෙහි නිමැවුම සියයට 2 කින් පමණ සුළු වශයෙන් පහත වැටුණි. උක් දඬු සැපයුම 1998 දී වූ මෙට්‍රික් ටොන් 197,000 සිට 1999 දී 192,000 දක්වා අඩු විය. උක් දඬුවල තත්ත්වය පහළ යාමද නිමැවුමෙහි අඩු වීමට හේතු විය.

## 4.3 එකතු කළ අගය හා ධාරිතා උපයෝජනය

1999 දී කර්මාන්ත අංශයෙහි එකතු කළ අගය නාමික වශයෙන් සියයට 10.8 කින් වැඩි විය. කර්මාන්ත අංශයෙහි නිෂ්පාදන වටිනාකමෙහි ප්‍රතිශතයක් ලෙස 1998 දී සියයට 35.2 ක් වූ එකතු කළ අගය 1999 දී සියයට 36 දක්වා වැඩි විය. ව්‍යවසායකයන්ගේ කාර්යක්‍ෂම මිල ප්‍රතිපත්ති හා අමු ද්‍රව්‍ය මිල පහළ යාම 1999 වසර තුළදී එකතු කළ අගය වැඩි වීමට හේතු විය. වසර තුළදී එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 4.5 කින් වැඩි විය. උසස් තාක්‍ෂණය භාවිතය සහ නිෂ්පාදන පිරිවැය පහළ යාම හේතුවෙන් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන සහ දව හා දව නිෂ්පාදන යන කාණ්ඩයන්හී එකතු කළ අගයෙහි වැඩි වීමක් වාර්තා විය. දව හා දව නිෂ්පාදන; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන; සකස් කළ ලෝහ නිෂ්පාදන; ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන සහ කඩදසි සහ කඩදසි නිෂ්පාදන යන කාණ්ඩයන්හි එකතු කළ අගයෙහි අනුපාතය සියයට 45 කට වඩා වැඩි විය. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදනයන්හි එකතු කළ අගය 1999 දී සියයට 30.9 ක් විය. අවම එකතු කළ අගය වූ සියයට 22.1 වාර්තා වූයේ රසායනික ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි.

4.5 රූප සටහන
කාර්මික නිෂ්පාදනයෙහි එකතු කළ වටිනාකම් ප්‍රතිශතය-1999




1999 දී, ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි දනට පවත්නා ධාරිතාවය සියයට 2.1 කින් තවදුරටත් පුළුල් විය. උසස් තාක්‍ෂණය භාවිතය වෙනුවෙන් ආනයන කරණු ලබන යන්ත්‍ර සූත්‍ර සඳහා බලපැවැත්වූ සහනදායී බදු අනුපාත හා සහනදායී ජාතික ආරක්‍ෂක බදු වැනි මූල්‍ය දිරි ගැන්වීම් වලින් දිරිමත් වූ කර්මාන්තකරුවෝ වසර තුළදී ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාවය

**4.5 සංඛ්‍යා සටහන**
**කර්මාන්ත අංශයේ එකතු වූ අගය**
**(පවත්නා මිල ගණන් අනුව)**

| කාණ්ඩය | රුපියල් දශලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999(අ) | 1998 | 1999(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 29,507 | 32,891 | 35,515 | 40,452 | 44,503 | 13.9 | 10.0 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 24,859 | 31,184 | 40,514 | 47,494 | 55,263 | 17.2 | 16.4 |
| 3. දව හා දව නිෂ්පාදිත | 1,177 | 1,250 | 1,257 | 1,312 | 1,390 | 4.4 | 5.9 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,458 | 2,580 | 2,633 | 2,578 | 2,664 | -2.1 | 3.3 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 6,898 | 8,957 | 10,745 | 14,274 | 13,832 | 32.8 | -3.1 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 9,726 | 10,537 | 11,600 | 12,463 | 13,817 | 7.4 | 10.9 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 347 | 450 | 598 | 710 | 777 | 18.7 | 9.4 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 4,547 | 4,809 | 5,924 | 6,779 | 7,367 | 14.4 | 8.7 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,319 | 2,763 | 3,157 | 3,426 | 3,799 | 8.5 | 10.9 |
| එකතුව | 81,838 | 95,421 | 111,943 | 129,488 | 143,412 | 15.7 | 10.8 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

පුළුල් කළහ. සිමෙන්ති හා පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි ධාරිතාවයෙහි පුළුල් වීමක් පෙන්නුම් කරමින් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩයෙහි ධාරිතාවය සියයට 5.3 කින් පුළුල් විය. රෙදිපිළි කර්මාන්තශාලා ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ රෙදිපිළි කම්හල්වල ධාරිතාවය පුළුල් වීමේ හේතුවෙන් වසර තුළදී රෙදිපිළි කර්මාන්තයෙහි ධාරිතාවය වැඩි විය. කඩදාසි හා කඩදාසි නිෂ්පාදන (සියයට 4.1), සකස් කළ ලෝහ නිෂ්පාදන (සියයට 5.0), රසායනික රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 3.5) සහ ආහාර පාන වර්ග සහ දුම්කොළ (සියයට 1.2) යන කාර්මික කාණ්ඩයන්හි ධාරිතාව පුළුල් වීම සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවැතිනි. වසරේ මුල් භාගයේදී කාර්මික නිෂ්පාදනය මන්දගාමී වීමේ හේතුවෙන් කර්මාන්ත අංශයෙහි සමස්ත ධාරිතා උපයෝජනය 1998 දී වූ සියයට 84 සිට 1999 දී සියයට 83 දක්වා සුළු වශයෙන් පහත වැටිණි.

## 4.4 නිෂ්පාදන පිරිවැය, ලාභදායිත්වය සහ සේවා නියුක්තිය

ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයෙහි සාමාන්‍ය ලාභ අනුපාතය 1998 දී වූ සියයට 13.3 සිට 1999 දී සියයට 12.2 දක්වා අඩු විය. ආයතන 475 ක් ආශ්‍රිතව 1999 දී පවත්වන ලද කාර්මික සමීක්ෂණයට අනුව මුළු නිෂ්පාදන පිරිවැය හා නිෂ්පාදන වටිනාකම අතර වෙනස පදනම් කරගෙන, ආයෝජන මණ්ඩලයට අයත් නොවන අංශයේ ලාභ අනුපාතය ඇස්තමේන්තු කර ඇත. දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන්වල මන්දගාමී වර්ධනය ලාභදායිත්වය අඩු වීමට හේතු විය. විශේෂයෙන් නැගෙනහිර ආසියාතික රට වලින් අඩු මිල ගණන්වලට ආනයනය කළ භාණ්ඩ හේතුවෙන් දේශීය වෙළඳපොළෙහි මිල ගණන් අඩු වූ අතර තරඟකාරීවය පවත්වා ගැනීම සඳහා නිෂ්පාදකයින් ජාත්‍යන්තර ගැණුම්කරුවන්ට ඉහළ වට්ටම් පිරිනැමූහ. කෙසේ වුවද, නිෂ්පාදන මිල අඩු වීමෙන් ලාභදායිත්වයෙහි ඇති වූ අවාසිදායක බලපෑම, ලෝක වෙළඳපොළෙහි අමු ද්‍රව්‍ය මිල අඩු වීමෙන් තරමක්දුරට සමහන් කිරීමට හේතුවිය. 1999 දී නිෂ්පාදන වියදමෙහි ප්‍රතිශතයක් ලෙස අමු ද්‍රව්‍ය මිල ගණන් ප්‍රතිශත ඒකක 2.5 කින් අඩු විය. පිරිවැය අඩු කර ගැනීමේ ක්‍රම හඳුන්වා දීමෙන් සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමෙන්, බොහෝ කාර්මික කාණ්ඩ පහළ නිෂ්පාදන මිල ගණන් නිසා ඇතිවිය හැකිව තිබූ ලාභදායිත්වය අඩු වීමේ ප්‍රවණතාවය අඩු කර ගත්හ. ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන සහ රසායනික රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන්හි පිරිවැය කැපී පෙනෙන ලෙස අඩු විය. ලාභදායිත්වය, රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයෙහි වූ සියයට 17.0 සිට ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩයේ වූ සියයට 8.8 ක පරාසයක් තුළ පැවැතිනි. අමු ද්‍රව්‍ය මිල පහළ යාම මෙන්ම කාර්යක්ෂම මිල ප්‍රතිපත්ති හේතුවෙන්, ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි විශාලතම උප අංශය වන ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයෙහි ලාභදායිත්වය 1998 දී වූ සියයට 12.5 සිට 1999 දී සියයට 12.8 දක්වා වැඩි විය. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනෙක සඳහන් නොවූ) කාණ්ඩයෙහි ලාභදායිත්වයද 1998 දී වූ සියයට 10.4 සිට 1999 දී සියයට 11.8 දක්වා සුළු වශයෙන් වැඩි විය. 1999 දී අනෙකුත් සියළුම කාණ්ඩවල ලාභදායිත්වය අඩු විය. අපනයන මිල ගණන් අඩු වීමේ හේතුවෙන් රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයෙහි ලාභදායිත්වය ප්‍රතිශත ඒකක 3.9 ක් වූ විශාලතම පහත වැටීම වාර්තා විය. කෙසේ වුවද, මෙම කාණ්ඩයෙහි වූ සියයට 17 ක ලාභදායිත්වය අනෙකුත් සියළුම කාණ්ඩ අතර ඉහළම ලාභ අනුපාතය විය.

1999 දී ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි සමස්ත ශ්‍රම පිරිවැය නාමික වශයෙන්

**4.6 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභය (අ)**

| කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු.ද.ල.) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු.ද.ල.) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|
| | 1998 | 1999 | 1998 | 1999 | 1998 | 1999 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 47,355 | 52,337 | 54,120 | 60,019 | 12.5 | 12.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 14,665 | 16,588 | 18,540 | 19,986 | 20.9 | 17.0 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,018 | 1,109 | 1,150 | 1,235 | 11.5 | 10.2 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 3,210 | 3,534 | 3,640 | 3,975 | 11.8 | 11.1 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 18,038 | 19,561 | 20,065 | 21,710 | 10.1 | 9.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 13,660 | 16,171 | 15,540 | 17,731 | 12.1 | 8.8 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,103 | 1,197 | 1,256 | 1,346 | 12.2 | 11.1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 7,379 | 8,447 | 8,531 | 9,512 | 13.5 | 11.2 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 3,235 | 3,401 | 3,611 | 3,857 | 10.4 | 11.8 |
| එකතුව | 109,663 | 122,345 | 126,453 | 139,371 | 13.3 | 12.2 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 11.8 කින් ඉහළ ගියේය. මෙම වැඩි වීම නිමැවුම සියයට 5.2 කින් පුළුල් වීමේද, සාමාන්‍ය මිල මට්ටම් සියයට 4.9 කින් ඉහළ යාමේද, ශ්‍රම බලකාය සියයට 2.1 කින් පුළුල් වීමේද, ශ්‍රම ඵලදායීතාව සියයට 1.9 කින් ඉහළ යාමේද ප්‍රතිඵලයක් විය. 1999 දී ශ්‍රම පිරිවැය සමස්ත නිෂ්පාදන වියදමෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.2 ක් ලෙස නොවෙනස්ව පැවතින. 1999 දී වූ පහළ උද්ධමන මට්ටම තුළ සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවති වැටුප් අනුපාතිකයන් ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තවල වැටුප් වියදමෙහි වර්ධනය සීමා කිරීමට හේතු විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ; දැව හා දැව නිෂ්පාදිත; කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත යන කාර්මික කාණ්ඩයන්හි මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස වැටුප් වියදම පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ශ්‍රම බලකායෙහි වැඩි වීම හේතුවෙන් රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන; රසායනික රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන සහ මූලික ලෝහ නිෂ්පාදන යන කාණ්ඩයන්හී ශ්‍රම පිරිවැය කොටස ඉහළ ගියේය. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන; දැව සහ දැව නිෂ්පාදන; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන්හි මුළු නිෂ්පාදන පිරිවැයෙන් ශ්‍රම පිරිවැය කොටස, සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුණි. ආහාර, පාන වර්ග සහ දුම්කොළ; මූලික ලෝහ නිෂ්පාදන සහ සකස් කළ ලෝහ නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන්හි මුළු පිරිවැයෙහි ශ්‍රම පිරිවැය කොටස පහළ මට්ටමක විය.

**4.7 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය (අ)**

**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| කාණ්ඩය | දේශීය පිරිවැය (ප්‍රතිශතයන්) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමු ද්‍රව්‍ය | | පොලිය | |
| | 1998 | 1999 | 1998 | 1999 | 1998 | 1999 | 1998 | 1999 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 2.3 | 2.2 | 9.5 | 9.3 | 39.2 | 38.5 | 1.8 | 1.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 3.4 | 3.2 | 15.7 | 16.1 | 16.4 | 16.2 | 2.1 | 2.0 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 8.5 | 8.1 | 17.0 | 16.4 | 38.6 | 39.1 | 4.9 | 4.1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2.3 | 2.4 | 13.2 | 12.6 | 15.3 | 16.1 | 5.1 | 4.7 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 4.5 | 4.2 | 12.5 | 12.9 | 29.1 | 28.1 | 3.8 | 4.1 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 16.0 | 16.0 | 16.2 | 16.5 | 20.1 | 19.1 | 4.1 | 4.2 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 7.8 | 7.6 | 10.1 | 10.8 | 34.6 | 33.9 | 4.2 | 3.8 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 3.0 | 2.6 | 11.9 | 11.1 | 23.1 | 21.5 | 4.1 | 3.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4.2 | 3.0 | 14.7 | 14.1 | 33.4 | 33.1 | 3.3 | 3.3 |
| එකතුව | 4.7 | 4.6 | 12.2 | 12.2 | 30.1 | 29.3 | 2.8 | 2.8 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


වසර තුළදී බලශක්ති වියදම සියයට 8.1 කින් වැඩි විය. 1998 දී මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 4.7 ක් ව පැවති බලශක්ති පිරිවැය 1999 දී සියයට 4.6 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන; ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන සහ රසායනික රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන් ඇතුළු බොහෝ කාර්මික කාණ්ඩයන්හි මුළු නිෂ්පාදන පිරිවැයෙහි බලශක්ති වියදම් කොටස අඩු විය. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩයේ මුළු නිෂ්පාදන පිරිවැයෙහි බලශක්ති වියදම් කොටස සියයට 15 කට වඩා වැඩි විය. බලශක්ති පිරිවැය, දුව හා දුව නිෂ්පාදන හා මූලික ලෝහ නිෂ්පාදන යන නිෂ්පාදන කාණ්ඩයන්හි සමස්ත නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රධාන මූලයක් විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදන කාණ්ඩයන්හි මුළු නිෂ්පාදන පිරිවැයෙන් බලශක්ති වියදම් කොටස පහළ මට්ටමක පැවතිනි.

1999 දී ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි පොලී වියදම සියයට 11 කින් ඉහළ ගියේය. මුළු නිෂ්පාදන පිරිවැයෙන් පොලී වියදම් කොටස සියයට 2.8 ක් ව නොවෙනස්ව පැවතින. උසස් තාක්ෂණය දිරි ගැන්වීමේ වැඩසටහන යටතේ අළුත් ව්‍යාපෘති පිහිටුවීම හා පවත්නා ව්‍යවසායයන්ගේ ධාරිතාවය පුළුල් වීම වසර තුළදී ණය සඳහා වූ ඉල්ලුම වැඩි වීමට හේතු විය. දුව හා දුව නිෂ්පාදන; කඩදාසි හා කඩදාසි නිෂ්පාදන; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන සහ රසායනික, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන්හි මුළු නිෂ්පාදන පිරිවැයෙන් පොලී වියදම් කොටස සියයට 4 කට වඩා අධික විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන සහ රෙදිපිළි ඇඟළුම් හා සම් නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන්හි පොලී වියදම් කොටස පහළ මට්ටමක පැවතින.

## කර්මාන්තයන්හි ශ්‍රම ඵලදයීතාවය

ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි මිනිස් පැයක එකතු කළ වටිනාකමේ මූර්ත අගයෙහි වෙනස පදනම් කරගෙන ඇස්තමේන්තු කර ඇති ශ්‍රම ඵලදයිතාවය

**4.6 රූප සටහන**
**කාර්මික නිෂ්පාදනයෙහි ශ්‍රම ඵලදයීතාවය (1995 = 100)**




1. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත
2. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත
3. දුව හා දුව නිෂ්පාදිත
4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත
5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත
6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත
7. මූලික ලෝහ නිෂ්පාදිත
8. සකස් කළ ලෝහ නිෂ්පාදිත
9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත
10. සමස්ත දර්ශකය

1999 දී සියයට 1.9 කින් ඉහළ ගියේය. නව තාක්ෂණය හා යන්ත්‍රසූත්‍ර හඳුන්වා දීම, පහළ හා මධ්‍යම මට්ටමේ කළමනාකරණය අතර ශ්‍රම ඵලදයීතාවය වැඩි කිරීමේ වාස පිළිබඳව දැනුවත් කිරීම, ශ්‍රමිකයකු සඳහා වූ ප්‍රාග්ධනයෙහි ක්‍රමික වර්ධනය, පුහුණුවීම් පුළුල් කිරීම, ඉහළ පරිපාලන ක්‍රමෝපායයන් භාවිතා කිරීම සහ ඇතැම් අවස්ථාවල අතිරික්ත සේවකයන් ඉවත් කිරීම නිසා කර්මාන්ත අංශයෙහි ශ්‍රම ඵලදයීතාවය වැඩි විය. නිෂ්පාදකයින් විසින් අනුගමනය කළ අපතේ යාම් අඩු කිරීමේ වැඩසටහන්, බලශක්ති පිරිමැසුම් ක්‍රම, වැඩ කිරීම සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කිරීම සහ සේවකයන් සමග යහපත් සේවක සම්බන්ධතා ඇති කර ගැනීම වැනි විවිධ ක්‍රමෝපායයන්ද ශ්‍රම ඵලදයීතාවය වැඩි වීමට හේතු විය. කෙසේ වුවද, වසරේ මුල් භාගයේදී පසුබෑමට

**4.8 සංඛ්‍යා සටහන**
**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදයිතා දර්ශකය(අ)**

1995=100

| කාණ්ඩය | 1998 | 1999 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 113.9 | 117.1 | 2.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 107.8 | 109.0 | 1.1 |
| 3. දුව හා දුව නිෂ්පාදිත | 101.3 | 101.4 | 0.1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 99.0 | 100.0 | 1.0 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 112.5 | 113.0 | 0.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 100.3 | 103.2 | 2.9 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 101.6 | 98.0 | -3.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 107.5 | 112.1 | 4.3 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 104.4 | 100.2 | -4.0 |
| එකතුව | 106.0 | 108.0 | 1.9 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ලක් වූ වෙළඳපොළ තත්ත්වයන් හේතුවෙන් බොහෝ කර්මාන්තයන්හි ධාරිතා උපයෝජනය අඩු මට්ටමක පැවැති නිසා මෙම පියවරවල සම්පූර්ණ ඵල නෙලා ගැනීමට කර්මාන්ත අංශයට නොහැකි විය. බොහෝ කාර්මික කාණ්ඩයන්හි එකතු කළ අගයෙහි වැඩි වීම හා ඵලදායීතාවය ඉහළ යාම අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන (සියයට 2.8), සකස් කළ ලෝහ නිෂ්පාදන (සියයට 4.3), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (සියයට 2.9) සහ රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන (සියයට 1.1) යන කාර්මික කාණ්ඩයන්හි ශ්‍රම ඵලදායිතාවය වැඩි විය. මූලික ලෝහ නිෂ්පාදන කාණ්ඩය සහ අනෙකුත් නිෂ්පාදන කාණ්ඩයන්හි ශ්‍රම ඵලදායීතාවය පහළ වැටුණි.

### කර්මාන්තයන්හි සේවා නියුක්තිය

අපනයනාභිමුඛ කර්මාන්තයන්හි සේවා නියුක්ති අවස්ථා පුළුල් වීම සලකුණු කරමින් කර්මාන්ත අංශයෙහි සේවා නියුක්තිය 1999 දී සියයට 9 කින් ඉහළ ගියේය. ආයෝජන මණ්ඩලය යටතේ හා ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තයන්හි සේවා නියුක්තිය පිළිවෙලින් සියයට11කින් හා සියයට 2 කින් වැඩි විය. ඇඟළුම් කම්හල් 50 වැඩසටහන ක්‍රියාත්මක වීම හා පවත්නා කර්මාන්තයන් පුළුල් වීමත් සමග ආයෝජන මණ්ඩලය යටතේ ගැනෙන ඇඟළුම් කර්මාන්තවල සේවා නියුක්ති අවස්ථා ඉහළ ගියේය. පුහුණු හා නුපුහුණු ශ්‍රමය හිඟ වීමේ හේතුවෙන් අපනයන සැකසුම් කලාපයන්හි හා නාගරික ප්‍රදේශවල පිහිටි ඇඟළුම් කර්මාන්තකරුවනට ඔවුන්ගේ කම්හල්වල වූ සියළු ඇබෑර්තු පිරවීමට නොහැකි විය. වසර තුළදී ආයෝජන මණ්ඩලයට අයත් නොවන සියළුම කාර්මික කාණ්ඩයන්හි සේවා නියුක්තිය ඉහළ ගියේය. කඩදාසි හා කඩදාසි නිෂ්පාදන; රෙදිපිළි ඇඟළුම් හා සම් නිෂ්පාදන; මූලික ලෝහ නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන්හි ශ්‍රම අවශෝෂණය කර ගැනීම ඉහළ මට්ටමක පැවතිනි. නවීන යන්ත්‍රසූත්‍ර භාවිතය සමග අතිරික්ත ශ්‍රමය අඩු කර තිබියදීත් මස් සැකසුම්, බිස්කට් සහ කිරි නිෂ්පාදන කර්මාන්තයන්හි ශ්‍රම අවශෝෂණය කර ගැනීම ඉහළ යාමේ හේතුවෙන් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයෙහි සේවා නියුක්තිය සියයට 1.9 කින් ඉහළ ගියේය. ප්‍රධාන පෙළේ නිෂ්පාදකයකු විසින් හඳුන්වා දෙනු ලැබූ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ ක්‍රමය හේතුවෙන් දුම්කොළ සැකසීමේ අංශයෙහි සේවා නියුක්තිය සැළකිය යුතු ලෙස අඩු විය. පළතුරු සැකසීමේ හා සීනි නිෂ්පාදන කර්මාන්තයන්හි සේවා නියුක්තියද වසර තුළදී අඩු විය. මුද්‍රණ හා ඇසුරුම් කර්මාන්තයෙහි ඉහළ ශ්‍රම අවශෝෂණය කර ගැනීම පිළිබිඹු කරමින් කඩදාසි හා කඩදාසි නිෂ්පාදන කර්මාන්තයෙහි සේවා නියුක්තිය සියයට 4.6 කින් වැඩි විය. රසායනික, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි, ඖෂධ හා බෙහෙත් වර්ග, ප්ලාස්ටික් හා රබර් නිෂ්පාදන යන උප අංශයන්හි සේවා නියුක්ති අවස්ථා වැඩි වශයෙන් සැලසින.

## 4.5 ආයෝජන

### විදේශ ආයෝජන

1999 වසර තුළදී ශ්‍රී ලංකාවට සැළකිය යුතු විදේශ ආයෝජන ප්‍රමාණයක් ඇද ගැනීමට හැකි විය. නව ව්‍යාපෘති සඳහා ශුද්ධ විදේශීය හිමිකම් ගලාඒම් සහ විදේශීය කොටස්කරුවන්ගේ අත්තිකාරම් වශයෙන් නිර්වචනය කළ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය 1998 දී වූ රුපියල් දශ ලක්ෂ 9,689 සිට 1999 දී රුපියල් දශ ලක්ෂ 16,261 ක් දක්වා සියයට 68 කින් වැඩි විය. එය වසරක් තුළදී වූ වාර්තාගත ඉහළම ආයෝජන ප්‍රමාණය විය. ආයෝජන ඉහළ නැංවීම පිළිබඳ වගකීම පැවරී ඇති ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන ආයෝජන මණ්ඩලය 1999 වසර තුළදී

**4.9 සංඛ්‍යා සටහන**
**පෞද්ගලික අංශයේ කර්මාන්තවල සේවා නියුක්තිය**

| කාණ්ඩය | 1998 | 1999 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| (i) ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්ත(අ) | | | |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 26,477 | 26,981 | 1.9 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 32,150 | 32,950 | 2.5 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 2,164 | 2,214 | 2.3 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 6,971 | 7,291 | 4.6 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 20,866 | 21,175 | 1.5 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 12,224 | 12,317 | 0.8 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 789 | 835 | 5.8 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 9,990 | 10,095 | 1.1 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5,751 | 5,941 | 3.3 |
| අනු එකතුව | 117,382 | 119,799 | 2.1 |
| (ii)ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් | 294,381 | 327,059 | 11.1 |
| මුළු එකතුව | 411,763 | 446,858 | 8.5 |


(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, ජපානය, ඉන්දියාව, ඉන්දුනීසියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රට වලින් සැළකිය යුතු ආයෝජන ප්‍රමාණයක් ඇද ගැනීමට සමත් විය. ආයෝජන මණ්ඩලය විසින් 1999 දී ආයෝජන ඉහළ නැංවීම සඳහා දකුණු කොරියාව, ඉන්දියාව, ස්වීඩනය, නෝර්වේ, සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, තායිවානය, ඉතාලිය සහ ස්විට්සර්ලන්තය යන රටවලට දූත මණ්ඩල පිටත් කර යවන ලදී. අපේක්ෂිත ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,408 කින් යුත් ඇමරිකා එක්සත් ජනපද "සන්මයික්‍රෝ සිස්ටම්" ආයතනය, අපේක්ෂිත ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 70 කින් යුත් මාදුරුඔය කුඩා විදුලිබලාගාර 3 හා අපේක්ෂිත ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,816 කින් යුත් "මාස්ට් කර්මාන්ත පුළුල් කිරීමේ ව්‍යාපෘතිය" වැනි නව ව්‍යාපෘති ද ඇතුළත්ව විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති ගණනාවක් මෙරටට ගෙන්වා ගැනීමට මෙම දූත මෙහෙවරවල් සමත් විය. 1999 දී ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි දනට කර ඇති ආයෝජන ප්‍රමාණය 1998 දී වූ රුපියල් දශ ලක්ෂ 151,206 සිට 1999 දී රුපියල් දශ ලක්ෂ 176,020 දක්වා සියයට 17.2 කින් වැඩි වී ඇත.

4.7 රූප සටහන

ආයෝජන මණ්ඩලය මගින් දනට කර ඇති ආයෝජන




ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලය 1998 දී අනුමත කළ රුපියල් දශ ලක්ෂ 104,024 ක ආයෝජනයන් සහිත ව්‍යාපෘති 405 හා සසඳන කළ 1999 දී රුපියල් දශ ලක්ෂ 103,915 ක් වටිනා ආයෝජනයන්ගෙන් සමන්විත ව්‍යාපෘති 342 ක් අනුමත කර ඇත. 1999 වර්ෂය අවසානය වනවිට අනුමත කර තිබූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 3,003 ක් විය. 1999 දී අනුමත කළ මුළු ආයෝජන ප්‍රමාණයෙහි අන්තර්ගත විදේශ ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 57,142 ක් හෙවත් මුළු ආයෝජනයන්ගෙන් සියයට 55 ක් විය. 1999 දී අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 82 ක් මුළුමණින්ම විදේශ හිමිකම් සහිත ව්‍යාපාරද, 100 ක් බද්ධ ව්‍යාපාරද, 160 ක් මුළුමණින්ම දේශීය හිමිකම් සහිත ව්‍යාපාරද විය. අනුමත කළ ව්‍යාපෘති වලින් සැපයෙන මුළු රැකියා අවස්ථා ප්‍රමාණය පුද්ගලයින් 60,950 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත කාණ්ඩයෙහි අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව 1998 දී වූ 132 සිට 1999 දී 51 දක්වා අඩු විය. සේවා අංශයෙහි අනුමත කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 185 ක් වූ අතර ඉන් වැඩි ප්‍රමාණයක් මෘදුකාංග දියුණු කිරීමේ ව්‍යාපෘති විය. 1999 දී රජය මගින් මෘදුකාංග දියුණු කිරීමේ කර්මාන්තයට විශේෂ දිරි ගැන්වීම් දෙනු ලැබිණ. රසායනික, ඛනිජ තෙල්, රබර් සහ පලාස්ටික් නිෂ්පාදන; ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන යන කර්මාන්තයන්හි ද සැළකිය යුතු ආයෝජන ප්‍රමාණයක් අනුමත විය.

1999 දී ආයෝජන මණ්ඩලය සමග ගිවිස ගත් ව්‍යාපෘතින්හි ආයෝජනය කැපී පෙනෙන ලෙස සියයට 45 කින් වැඩි විය. 1998 වසරේ දී ආයෝජන මණ්ඩලය ගිවිස ගත් රුපියල් දශ ලක්ෂ 46,772 ක ආයෝජන වටිනාකමක් සහිත ව්‍යාපෘති 230 සමග සැසඳීමේදී 1999 වසරේදී රුපියල් දශ ලක්ෂ 67,998 ක වටිනාකමක් සහිත ව්‍යාපෘති 207 ක් සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී. මේ අනුව 1999 වසර අවසානය වනවිට අත්සන් කළ මුළු ගිවිසුම් සංඛ්‍යාව 1,887 ක් බවට පත් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගිවිසගත් ව්‍යාපෘතියක සාමාන්‍ය ආයෝජන ප්‍රමාණය 1998 දී වූ රුපියල් දශ ලක්ෂ 203 සිට 1999 දී රුපියල් දශ ලක්ෂ 328 දක්වා වැඩි විය. ගිවිස ගත් ආයෝජනයන්හි විදේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 42,350 ක් හෙවත් මෙම ව්‍යාපෘතිවල මුළු ආයෝජන වටිනාකමින් සියයට 62 ක් විය. ගිවිස ගත් ව්‍යාපෘතීන් මගින් ජනනය කළ හැකි සේවා නියුක්ති අවස්ථා ගණන පුද්ගලයින් 42,838 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන; රසායන, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන; ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන යන කාර්මික කාණ්ඩ සහ මෘදුකාංක දියුණු කිරීමේ කර්මාන්ත 34 ක් ඇතුළු සේවා අංශයෙහි ව්‍යාපෘතීන් මෙම ආයෝජන ආකර්ශණය කර ගැනීමට සමත් විය. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් ප්‍රයිවට් ලිමිටඩ් (රුපියල් දශ ලක්ෂ 15,363), කලම්බු පවර් ප්‍රයිවට් ලිමිටඩ් (රුපියල් දශ ලක්ෂ 4,863), සිග්මා ඩිවලප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් (රුපියල් දශ ලක්ෂ 3,949) ක් ඇතුළත්ව මුළු ආයෝජන වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,000 කට වඩා වැඩි ව්‍යාපෘති 11 ක් මේ අතර විය. 1999 අවසානය වනවිට ගිවිස ගත් මුළු ව්‍යාපෘති වලින් රුපියල් දශ ලක්ෂ 145,795 ක වටිනාකමින් යුත් ව්‍යවසායයන් 1,070 ක් වාණිජ කටයුතුවල නිරතව සිටියහ. මෙම ව්‍යාපෘතීන්ගෙන් සැළකිය හැකි සේවා නියුක්ති අවස්ථා ගණන පුද්ගලයින් 294,957 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කටුනායක අපනයන සැකසුම් කලාපයේ ව්‍යවසායයන් 96 ක්ද, බියගම අපනයන සැකසුම් කලාපයෙහි 60 ක් ද, කොග්ගල අපනයන සැකසුම් කලාපයෙහි 11 ක් ද, මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානයෙහි 4 ක් ද, මීරිගම අපනයන සැකසුම් කලාපයෙහි 4 ක් ද, මහනුවර කර්මාන්තපුරයෙහි 4 ක් ද, සීතාවක කාර්මික පුරයෙහි 6 ක් ද, වතුපිටිවල අපනයන සැකසුම් කලාපයෙහි 6 ක් සහ අපනයන සැකසුම් කලාපයන්ගෙන් පිටත ව්‍යවසායයන් 880 ක් ස්ථානගතව තිබුණි.

**4.10 සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් දැනට කර ඇති ආයෝජන (අ)**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | විදේශ ආයෝජන (රු.ද.ල.) | | මුළු ආයෝජන (රු.ද.ල.) (ආ) | |
|---|---|---|---|---|---|---|
| | 1998(ඇ) | 1999(ඈ) | 1998(ඇ) | 1999(ඈ) | 1998(ඇ) | 1999(ඈ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 149 | 147 | 5,200 | 5,475 | 11,392 | 11,801 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 386 | 417 | 16,819 | 18,248 | 25,021 | 28,630 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 26 | 25 | 671 | 578 | 935 | 973 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 22 | 21 | 461 | 489 | 649 | 698 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 101 | 100 | 7,121 | 7,930 | 9,370 | 10,329 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 66 | 63 | 3,044 | 4,081 | 4,841 | 6,999 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 35 | 38 | 2,832 | 4,703 | 3,616 | 5,661 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 171 | 158 | 5,646 | 5,105 | 8,853 | 8,225 |
| 9. සේවා | 402 | 430 | 58,438 | 70,363 | 86,529 | 102,704 |
| එකතුව | 1,358 | 1,399 | 100,232 | 116,972 | 151,206 | 176,020 |

(අ) වර්ෂය අවසානයේ එකතු වූ අගය
(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ආයෝජන මණ්ඩල පනතේ 16 වැනි වගන්තිය (සාමාන්‍ය නීතිය) යටතේ ආයෝජන මණ්ඩලය 1998 වසරේදී අනුමත කළ රුපියල් දශ ලක්ෂ 5,856 ක ආයෝජනයන්ගෙන් සමන්විත ව්‍යාපෘති 93 ක් හා සසඳන කළ 1999 දී රුපියල් දශ ලක්ෂ 3,391 ආයෝජන වටිනාකමක් ඇති ව්‍යාපෘති 136 ක් අනුමත කර ඇත. 1999 දී අනුමත කළ මුළු ආයෝජන ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 2,481 ක් හෙවත් සියයට 73 ක් විදේශ මූලයන්ගෙන් ලැබුණි. මේවායින් ව්‍යවසායයන් 72 ක් මුළුමණින්ම විදේශිකයින්ට අයත් වූ අතර, 64 ක් බද්ධ ව්‍යාපාරයන් විය. 1999 අවසානය වනවිට වාණිජ කටයුතුවල නිරතව සිටි ව්‍යවසායයන් ගණන 471 ක් විය. මෙම ව්‍යාපෘති වල ඇස්තමේන්තුගත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 19,668 ක් වූ අතර මින් රුපියල් දශ ලක්ෂ 10,561 ක් හෙවත් සියයට 54 ක් විදේශ මූලයන්ගෙන් ලැබුණු ඒවා විය. මෙම ව්‍යාපෘතීන්ගෙන් සැපයිය හැකි සේවා නියුක්ති අවස්ථා ගණන පුද්ගලයන් 38,889 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත; ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන; රසායනික ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ සකස් කළ ලෝහ නිෂ්පාදන යන අංශවල ප්‍රධාන වශයෙන් මෙම ආයෝජනයන් කර තිබුනි.

## දේශීය ආයෝජන

ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ අනුමත කළ ව්‍යාපෘතීන්හි දේශීය ආයෝජන ප්‍රමාණය, 1998 දී වූ සියයට 42 සිට 1999 දී සියයට 45 දක්වා සුළු වශයෙන් වැඩි විය. පෙර වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 43,303 ක් හා සමග සැසඳීමේදී මෙම ව්‍යාපෘති වල අනුමත මුළු දේශීය ආයෝජන ප්‍රමාණය 1999 දී රුපියල් දශ ලක්ෂ 46,773 ක් විය. මේ අතර වසර තුළදී අත්සන් කරන ලද

**4.11 සංඛ්‍යා සටහන**
**ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම්**


| කාණ්ඩය | සේවා නියුක්තිය දෙසැම්බර් අවසානයට | | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශලක්ෂ | |
|---|---|---|---|---|
| | 1998 (අ) | 1999 (අ) | 1998 | 1999 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 11,699 | 11,571 | 9,329 | 8,274 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 189,395 | 216,700 | 114,794 | 127,007 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 2,723 | 2,148 | 380 | 344 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 871 | 969 | 1,137 | 941 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 25,699 | 24,234 | 20,270 | 21,956 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 10,920 | 12,559 | 5,742 | 7,886 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 2,503 | 3,998 | 3,425 | 1,829 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 31,538 | 32,958 | 16,718 | 18,966 |
| 9. සේවා(ආ) | 19,033 | 21,922 | 9,963 | 13,002 |
| එකතුව | 294,381 | 327,059 | 181,758 | 200,205 |

(අ) තාවකාලික
(ආ) එයාර් ලංකා සමාගම හැර

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**4.8 රූප සටහන**

**අනුමත කළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘති**




ව්‍යාපෘතිවල ඇස්තමේන්තු කරන ලද මුළු දේශීය ආයෝජන වටිනාකම රුපියල් දශ ලක්ෂ 25,648 ක් වූ අතර පෙර වසරේදී එය රුපියල් දශ ලක්ෂ 20,924 ක් විය. 1999 වසර අවසානය වනවිට ආයෝජන මණ්ඩලය යටතේ වාණිජ කටයුතුවල නියැලි ව්‍යාපෘති 1,070 හි ආයෝජන වලින් රුපියල් දශ ලක්ෂ 63,652 ක් හෙවත් මුළු ආයෝජන වලින් සියයට 44 ක් දේශීය ආයෝජනයන් විය. ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය (සාමාන්‍ය නීතිය) යටතේ අනුමත කළ ව්‍යාපෘතිවල දේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 909 ක් හෙවත් මුළු ආයෝජනයන්ගෙන් සියයට 27 ක් විය.

1999 වසර අවසානය වනවිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන් 1,763 හි මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 116,344 ක් විය. මෙම කර්මාන්තයන්ගෙන් අපේක්ෂිත සේවා නියුක්ති ප්‍රමාණය පුද්ගලයන් 308,627 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. රෙදිපිළි ඇඟළුම් හා සම් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත; රසායනික, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත; සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත යන අංශයන්හි මෙම ආයෝජනයන් කර ඇත.

## 4.6 කර්මාන්ත අංශයට ලබා දී ඇති ණය

1998 වසරට සාපේක්ෂව 1999 වසර තුළදී අඩු පොළී අනුපාත යටතේ කර්මාන්ත අංශයට ණය මුදල් ලබා ගැනීමට හැකිව තිබුණි. සංවර්ධන බැංකු තුළින් ක්‍රියාත්මක වූ ජාත්‍යන්තර ණය සැපයුම් මාර්ග කිහිපයක් අඩු පොලියට ණය ප්‍රදානය කළහ. කර්මාන්ත සඳහා අඩු පොලී ණය සැපයීම වාණිජ බැංකුවල ද්‍රවශීලතාවය වැඩි වීමෙහි ද ප්‍රතිඵලයක් විය. ප්‍රධාන සංවර්ධන බැංකු දෙක වන ජාතික සංවර්ධන බැංකුව හා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව මගින් විශේෂ ව්‍යාපෘති යටතේ සෘජු ණය පහසුකම් වශයෙන් දිගුකාලීන සහ මැදිකාලීන ණය කොටස් ප්‍රාග්ධනය හා ණය පහසුකම් සපයන ලද අතර වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශයට කෙටිකාලීන මෙන්ම මැදිකාලීන හා දිගුකාලීන ණය සැපයීම නොකඩවා සිදු කෙරිණ. විදේශීය වාණිජ මූලයන්ගෙන් හා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු අරමුදල් යොදා ගනිමින් 1997 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද සුළු හා මධ්‍ය කාලීන ව්‍යවසාය ආධාර ව්‍යාපෘතිය යටතේ ජාතික සංවර්ධන බැංකුව මගින් වසර තුළදී ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දෙන ලදී. මෙයට අමතරව, ජපාන ආර්ථික සහයෝගිතා අරමුදලින් මූල්‍යාධාර වශයෙන් ලද ඩොලර් දශ ලක්ෂ 46 ක් සහිතව 1998 ජූනි මාසයේදී හඳුන්වා දෙන ලද තවත් ණය සැපයීමේ ව්‍යාපෘතියක් වන කුඩා සහ සුළු කර්මාන්ත නායකත්ව සහ ව්‍යවසායකත්ව ප්‍රවර්ධන කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සලසා ඇත.

වාණිජ බැංකු අත්තිකාරම් සහ තැන්පතු පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණයට අනුව වසරේ මුල් මාස 9 තුළදී වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශයට සපයන ලද වාණිජ බැංකු ණය 1998 දී වූ රුපියල් බිලියන 26.7 සිට 1999 දී රුපියල් බිලියන 28.7 ක් දක්වා සියයට 7.3 කින් වැඩි විය. 1999 දී ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව රුපියල් දශ ලක්ෂ 15,298 ක මූල්‍ය ආධාර කර්මාන්ත අංශයට සපයා ඇත. මෙය 1998 දී අනුමත කළ රුපියල් දශලක්ෂ 22,016 ට වඩා අඩු වීමක් වුවද 1998 දී අනුමත කළ 2,564 ක් වූ ව්‍යාපෘති ගණන 1999 දී 5,266 දක්වා වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ජාතික සංවර්ධන බැංකුව කුඩා හා සුළු කර්මාන්ත ව්‍යවසායක ආධාර ව්‍යාපෘතිය හා කුඩා සහ සුළු කර්මාන්ත නායකත්වය සහ ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය කිරීමේ

ව්‍යාපෘතිය යටතේ කුඩා හා සුළු සහ මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දීමය. මෙම අනුමත ණය මුදලින් රුපියල් දශ ලක්ෂ 4,318 ක මුදලක් රසායනික රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 1,276 ක් සඳහා ද, රුපියල් දශ ලක්ෂ 2,439 ක් ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අංශයෙහි ව්‍යාපෘති 1,366 ක් සඳහා ද, අනෙකුත් රුපියල් දශ ලක්ෂ 1,922 රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන අංශයෙහි ව්‍යාපෘති 461 ක් සඳහාද සපයා ඇත.

1999 දී ජාතික සංවර්ධන බැංකුව විවිධ ණය යෝජනා ක්‍රම යටතේ ව්‍යාපෘති 1,201 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 8,103 ක් අනුමත කර ඇත. මෙයින් රුපියල් දශ ලක්ෂ 3,260 ක් රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 223 ක් සඳහාද, රුපියල් දශ ලක්ෂ 1,454 ක් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 99 ක් සඳහාද, රුපියල් දශ ලක්ෂ 1,122 ක් ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 207 ක් සඳහාද අනුමත කර ඇත. ජාතික සංවර්ධන බැංකුව 1999 දී ව්‍යාපෘති 3,292 ක් වෙනුවෙන් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක ආධාර ව්‍යාපෘතිය හා කුඩා සහ සුළු කර්මාන්ත නායකත්ව සහ ව්‍යවසායකත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ රුපියල් දශ ලක්ෂ 2,557 ක ප්‍රතිමූල්‍ය පහසුකම් සපයා ඇත. මෙයින් රුපියල් දශ ලක්ෂ 794 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයෙහි ව්‍යාපෘති 1,056 ක ද, රුපියල් දශ ලක්ෂ 674 ක් රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 1,011 ක ද, රුපියල් දශ ලක්ෂ 494 ක් සකස් කළ ලෝහ නිෂ්පාදිත යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ කාණ්ඩයෙහි ව්‍යාපෘති 493 ක් සඳහාද අනුමත කර ඇත.

ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව මගින් අනුමත කරන ලද මූල්‍ය පහසුකම් ප්‍රමාණය 1998 දී වූ රුපියල් දශ ලක්ෂ 4,488 සිට 1999 දී රුපියල් දශ ලක්ෂ 4,638 දක්වා සියයට 3.3 කින් වැඩි විය. මෙම මූල්‍ය පහසුකම් රුපියල් දශ ලක්ෂ 4,538 ක සෘජු ණය වලින් සහ රුපියල් දශලක්ෂ 100ක හිමිකම් ප්‍රාග්ධන ප්‍රමාණයන්ගෙන් සමන්විත විය. වසර තුළදී ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයෙහි එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 100 ක හිමිකම් ප්‍රාග්ධන ප්‍රමාණයක් සපයා ඇත. අනුමත කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 1998 දී වූ ව්‍යාපෘති 430 සිට 1999 දී ව්‍යාපෘති 772 දක්වා වැඩි වී ඇත. සෘජු ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 1,160 ක් සකස් කළ ලෝහ නිෂ්පාදන අංශයෙහි ව්‍යාපෘති 52 ක් සඳහා ද, රුපියල් දශ ලක්ෂ 423 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අංශයෙහි ව්‍යාපෘති 102 ක් සඳහා ද, රුපියල් දශ ලක්ෂ 384 ක් රසායනික, ඛනිජ තෙල් රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අංශයෙහි ව්‍යාපෘති 42 ක් සඳහා ද අනුමත කර තිබුණි.

## 4.7 කාර්මික ප්‍රතිපත්තිය

පෞද්ගලික අංශයේ මූලිකත්වයෙන් යුත් අපනයන පෙරදැරි කර ගත් කාර්මික ප්‍රතිපත්තිය රජය මගින් තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන ගියේය. එහි අරමුණ වූයේ දේශීය කාර්මික පදනම පුළුල් කිරීම, නව රැකියා අවස්ථා ඇති කිරීම, කර්මාන්ත විවිධාංගීකරණය හා පුළුල් කිරීම, භෞතික

**4.12 සංඛ්‍යා සටහන**

**ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව විසින් කර්මාන්ත අංශයට සපයා ඇති මූල්‍ය පහසුකම් - 1999 (අ)**

| කාණ්ඩය | ජාතික සංවර්ධන බැංකුව | | | | | | | | ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව | | | | | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සුළු හා මධ්‍ය පරිමාණ සහයෝගිතා වැඩසටහන යටතේ අනුමත ප්‍රතිමූල්‍ය පහසුකම් | | සෘජු මූල්‍ය පහසුකම්(ආ) | | ප්‍රාග්ධන සහභාගිත්වය | | එකතුව | | අනුමත කළ ණය | | ප්‍රාග්ධන සහභාගිත්වය | | එකතුව | | | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 1,056 | 794 | 207 | 1,122 | - | - | 1,263 | 1,916 | 102 | 423 | 1 | 100 | 103 | 523 | 1,366 | 2,439 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 329 | 219 | 99 | 1,454 | - | - | 428 | 1,673 | 33 | 249 | - | - | 33 | 249 | 461 | 1,922 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 203 | 188 | 86 | 176 | - | - | 289 | 364 | 29 | 47 | - | - | 29 | 47 | 318 | 411 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 200 | 188 | 6 | 92 | - | - | 206 | 280 | - | - | - | - | - | - | 206 | 280 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 1,011 | 674 | 223 | 3,260 | - | - | 1,234 | 3,934 | 42 | 384 | - | - | 42 | 384 | 1,276 | 4,318 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | - | - | - | - | - | - | - | - | 7 | 8 | - | - | 7 | 8 | 7 | 8 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 493 | 494 | 5 | 23 | - | - | 498 | 517 | 52 | 1,160 | - | - | 52 | 1,160 | 550 | 1,677 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | - | - | 575 | 1,976 | - | - | 575 | 1,976 | 507 | 2,267 | - | - | 507 | 2,267 | 1,082 | 4,243 |
| එකතුව | 3,292 | 2,557 | 1,201 | 8,103 | - | - | 4,493 | 10,660 | 772 | 4,538 | 1 | 100 | 773 | 4,638 | 5,266 | 15,298 |

(අ) තාවකාලික
(ආ) ව්‍යාපෘති සහ උපකරණ මූල්‍ය ණය පමණි.

මූලය : ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව
ජාතික සංවර්ධන බැංකුව

හා මිනිස් බල සම්පත්හි කාර්යක්ෂම කළමනාකරණය සහ කර්මාන්ත ප්‍රාදේශීයකරණය ව්‍යාප්ත කිරීමය. ආයෝජන ආකර්ශණය කර ගැනීම, ඵලදායීතාවය වැඩි කිරීම හා තරඟකාරිත්වය ඉහළ නැංවීමේ බලාපොරොත්තුවෙන් රජය දේශීය හා විදේශීය ආයෝජකයින්ට පුළුල් පරාසයක දිරි ගැන්වීම් පිරිනමන ලදී. 1997 දී දියත් කළ ජාතික ඵලදායිතා දශක වැඩසටහන හා 1996 දී උසස් තාක්ෂණය හඳුන්වා දීම වෙනුවෙන් පිරිනමන ලද මූල්‍ය දිරි ගැන්වීම් කර්මාන්ත අංශයේ ඵලදායීතාවය ඉහළ නැංවීමට උපකාරී වූ අතර එමගින් ඒකකයක නිෂ්පාදන පිරිවැය අඩු විය. මෙම ප්‍රතිපත්තීන් සහ සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවැති උද්ධමන හා පොලී අනුපාතයන්, ලෝක ආර්ථිකයෙහි මෑතකදී ඇතිවූ අර්බුදයෙන් දේශීය ආර්ථිකයට වූ අහිතකර බලපෑම් යම් දුරට අඩු කර ගැනීමට උපකාරී විය.

කර්මාන්ත අංශයේ වර්ධනය වේගවත් කිරීම හා කර්මාන්ත පදනම විවිධාංගීකරණය කිරීම අරමුණු කොට ගෙන ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජ්‍යායතනය හා එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානයෙහි සහාය ඇතිව, 1999 දී රජය කාර්මීකරණය හා ආයෝජන දිරි ගැන්වීමේ ප්‍රධාන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත්තේය. මෙම ආයතන දෙක සමග සහයෝගීතාවයෙන් 2000 - 2010 කාලය සඳහා ප්‍රධාන සැලැස්ම සැකසීමේ වගකීම කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරී ඇත. 2000 වසරේ මැද භාගය වනවිට මෙම ප්‍රධාන සැලැස්ම අවසන් කිරීමට අපේක්ෂිතය. මෙම ප්‍රධාන සැලැස්ම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු 1999 පෙබරවාරි මස පටන් ගත් අතර එහි පළමු අදියර දැනටමත් සම්පූර්ණ කර ඇත. කෘෂිකාර්මය ආශ්‍රිත කර්මාන්ත, ඇඟළුම් කර්මාන්තය, සම් සහ පාවහන් කර්මාන්තය, රබර් සහ ප්ලාස්ටික් සැකසීමේ කර්මාන්තය, යන්ත්‍රසූත්‍ර කර්මාන්තය, විදුලි/විද්‍යුත් කර්මාන්තය සහ තොරතුරු තාක්ෂණ සේවා කර්මාන්ත යන සංවර්ධනය කිරීම සඳහා ඉලක්ක කර ගත් කාර්මික අංශ හයක් සවිස්තරාත්මකව අධ්‍යයන කළයුතු යයි හඳුනාගෙන ඇත. ජාතික කාර්මීකරණ වැඩසටහන හා ක්‍රමෝපායයන්ගෙන් සමන්විත ප්‍රධාන සැලැස්මේ දෙවන අදියරේදී දියුණු කළයුතු යයි ඉලක්ක කර ගත් කර්මාන්ත සංවර්ධනය සඳහා සැලැස්ම සකස් කරනු ඇත.

1999 අයවැය මගින් යෝජනා කර ඇති පරිදි රේගු ආඥා පනත සහ එහි ක්‍රමෝපායන් සම්පූර්ණ විමර්ශනයට ලක් කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විශේෂඥයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබ ඇත. ඒ අතර අපනයන ඇඟළුම් නිෂ්පාදකයින් මුහුණ දුන් රේගුව හා සම්බන්ධ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රෙදිපිළි හා ඒ හා සම්බන්ධ අනෙකුත් භාණ්ඩ සඳහා වන ආනයන බදු ඉවත් කරනු ලැබිණ. දේශීය නිෂ්පාදකයින්ට ඔවුන්ගේ නිෂ්පාදන වියදම් අඩු කර ගැනීමටත් එමගින් ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා ඇති තරඟකාරිත්වය ඉහළ නැංවීමටත් ආනයනිත සියළුම කාර්මික අමු ද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර සඳහා වූ බදු අනුපාත සියයට 5 ක මට්ටමක තබන ලදී.

වාණිජ හා සමාජයීය යටිතල පහසුකම්වල පවත්නා අඩුපාඩු කාර්මික අංශයේ වර්ධනයට මෙන්ම භූගෝලීය වශයෙන් කර්මාන්ත විවිධාංගීකරණයට ප්‍රධාන බාධාවක්ව පවතී. එබැවින් රජය, කාර්යක්ෂම හා ගුණාත්මක ලෙස යටිතල පහසුකම් දියුණු කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් විදුලි, බලය ජනනය කිරීම, විදුලි සංදේශ, වරාය සංවර්ධන, මහා මාර්ග සංවර්ධනය, කාර්මික උද්‍යාන සහ කාර්මික පුර වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඉදි කිරීම ක්‍රියාත්මක කිරීම හා හිමිකර ගැනීම/ඉදි කිරීම ක්‍රියාත්මක කිරීම හා පැවරීම (BOO/BOT) යන ක්‍රම යටතේ පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරි ගැන්වීය. ඇතැම් ප්‍රධාන කර්මාන්තයන්හි පුහුණු ශ්‍රම හිඟයට පිළියමක් ලෙස 1999 දී පුහුණු ශ්‍රමය සංවර්ධනය කිරීමේ අරමුදලක් පිහිටුවන ලදී. මෙම අරමුදලෙහි අරමුණු වූයේ රැකියාවන් සඳහා පුහුණු කර ඇතුළත් කර ගැනීම, සේවකයන් නැවත පුහුණු කිරීම හා උසස් කිරීම මෙන්ම ව්‍යාපාර පදනම් කර ගත් පුහුණුව සඳහා සේව්‍යයන් දිරි ගැන්වීමය. පුහුණු කිරීමේ පහසුකම් සැලසීම සඳහා පෞද්ගලික අංශයේ මැදිහත් වීම දිරි ගැන්වීමේ අදහස ඇතිව, රජය මැණික් හා ස්වර්ණාභරණ, විද්‍යුත්, පරිගණක මෘදුකාංග, ඇඟළුම් යන ප්‍රමුඛ අංශවල අවම වශයෙන් පුද්ගලයින් 300 ක් වත් පුහුණු කරනු ලබන ආයතනවලට පස් අවුරුදු බදු විරාමයක් දෙනු ලැබිණ. සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව දිය යුතු අංශයක් ලෙස තොරතුරු තාක්ෂණ අංශය හඳුනා ගනිමින් 1998 අයවැය යෝජනා මගින් මෘදුකාංග දියුණු කිරීමේ කර්මාන්තය සඳහා පස් අවුරුදු බදු විරාමයක් සහ අනෙකුත් ආයෝජන මණ්ඩල දිරි ගැන්වීම් ප්‍රදානය කරනු ලැබින. මේ අංශයේ පුහුණු කිරීමේ කටයුතු ඉහළ නැංවීම සඳහා දිරි ගැන්වීම් තවදුරටත් වැඩි කරමින්, අවම වශයෙන් රුපියල් දශ ලක්ෂ 15 ක ආයෝජනයක් හා වසරකට පුද්ගලයින් 300 ක් පුහුණු කිරීමේ හැකියාව ඇති පරිගණක පුහුණු කිරීමේ ආයතනවලට 1999 අයවැය යෝජනා මගින් පස් අවුරුදු බදු විරාමයක් ප්‍රදානය කරනු ලැබින.

## කර්මාන්ත අංශයට සපයා ඇති දිරිදීම්

දේශීය නිෂ්පාදකයින් විසින් උසස් තාක්ෂණ භාවිතය ඉහළ නැංවීම අරමුණු කොට ගෙන 1996 දී හඳුන්වා දෙන ලද මූල්‍ය දිරි ගැන්වීම් යෝජනා ක්‍රමය 1999 අයවැය යෝජනා මගින් තවත් අවුරුදු 2 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. මෙම යෝජනා ක්‍රමය මගින් රුපියල් දශ ලක්ෂ 4 කට වැඩි ආයෝජනයක් සහිත නව ව්‍යවසායයන්ට හා රුපියල් දශ ලක්ෂ 1 ට වැඩි ආයෝජනයක් සහිත දැනට පවත්නා ව්‍යවසායයන්ට අනුමත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ බදු රහිතව ආනයනය කිරීමට හා වර්ධක ලාභාංශ මත පස් අවුරුදු බදු විරාමයක් පිරිනැමින. සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ උසස් තාක්ෂණ භාවිතය දිරි ගැන්වීම සඳහා අනුමත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයනය සම්බන්ධයෙන් පනවා තිබූ අවම ආයෝජන අවශ්‍යතාවය 1999 දී ඉවත් කරනු ලැබිණ. මේ යෝජනා ක්‍රමය යටතේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් රුපියල් දශ ලක්ෂ 1,914 ක ආයෝජන සහිත නව ව්‍යාපෘති 40 ක් සහ

රුපියල් දශ ලක්ෂ 1,121 ක ආයෝජන සහිත දැනට පවත්නා ව්‍යාපෘති 40 ක් සඳහා අනුමැතිය දී ඇත. මේ අනුව, මෙම යෝජනා ක්‍රමය පටන් ගත් දින සිට මේ දක්වා අනුමත කළ නව ව්‍යාපෘති හා දැනට පවත්නා ව්‍යාපෘති ගණන පිළිවෙලින් 179 සහ 418 ක් වේ. මෙම ව්‍යාපෘතීන්හි ආයෝජනය රුපියල් දශ ලක්ෂ 38,557 ක් වූ අතර, පුද්ගලයින් 36,649 දෙනෙකුට මෙම ව්‍යාපෘති මගින් සෘජු රැකියා අවස්ථා සැපයිය හැකි බවට ඇස්තමේන්තු කර ඇත. 1999 අවසානයට මෙම යෝජනා ක්‍රමය යටතේ අනුමත ව්‍යාපෘති 356 ක් මගින් රුපියල් දශ ලක්ෂ 9,520 ක වටිනාකමක් ඇති යන්ත්‍රසූත්‍ර ආනයනය කරනු ලැබ ඇත.

දේශීය රෙදිපිළි කර්මාන්ත කරුවන් ඔවුන්ගේ රෙදිපිළි කම්හල් නවීකරණය කිරීමට සහ නව තාක්ෂණ භාවිතය දිරිමත් කිරීම සඳහා 1998 දී හඳුන්වා දෙන ලද "දේශීය රෙදිපිළි කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන" 1999 වර්ෂය තුළදී තවදුරටත් පවත්වාගෙන යන ලදී. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වාර්තා අනුව 1999 අවසානය වනවිට මෙම වැඩසටහන යටතේ ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව 128 කි. මෙයින් අයදුම්පත් 124 ක් සහන කටයුතු තෝරා ගෙන ඇති අතර අයදුම්පත් 4 ක් සහන කටයුතු සඳහා සලකා බලමින් පවතී. 1999 දෙසැම්බර් අවසානය වනවිට ගෙවීමට ඇති මුළු ණය ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 3,998 ක් "රෙදිපිළි ණය ආපසු අය කර ගැනීමේ අරමුදලට" මාරු කිරීම සඳහා තෝරාගෙන ඇත. ත්‍රෛපාක්ෂික ගිවිසුම අවසන් කිරීමෙන් පසුව නිෂ්පාදකයන් 65 දෙනෙකුගේ ගෙවීමට ඇති රුපියල් දශ ලක්ෂ 2,910 කට ආසන්න මුදලක් 1999 දී "රෙදිපිළි ණය ආපසු අය කර ගැනීමේ අරමුදලට" මාරු කර ඇත. 1999 දෙසැම්බර් මස අවසානය වනවිට රෙදිපිළි ණය ආපසු අය කර ගැනීමේ අරමුදලට මාරු කිරීම සඳහා රජය රුපියල් දශ ලක්ෂ 517 කට ආසන්න මුදලක් බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට ගෙවා ඇත. 1999 දෙසැම්බර් මස අවසානය වනවිට ව්‍යවසායකයින් 98 දෙනෙකු ඔවුන්ගේ ප්‍රතිව්‍යුහගත කිරීමේ/නවීකරණය කිරීමේ යෝජනා ඉදිරිපත් කර තිබූ අතර එයින් ව්‍යවසායකයින් 73 කගේ අයදුම්පත් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම/නවීකරණය කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමට ඔවුන්ගේ බැංකු/මූල්‍ය ආයතන මගින් දැනටමත් තහවුරුව ලබා දී ඇත. මෙම ව්‍යවසායකයින් 73 දෙනාගෙන් ව්‍යවසායකයින් 25 දෙනෙකු දැනටමත් ඔවුන්ගේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘති ආරම්භ කර ඇත. භාණ්ඩාගාරය, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනෙහි දෙවන අදියර ක්‍රියාත්මක කළයුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කරමින් පවතී. මේ සඳහා මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමට තීරණය කර ඇති අතර දැනට කමිටුවේ ව්‍යවස්ථා සකස් කෙරෙමින් පවතී. රෙදිපිළි නිෂ්පාදන ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ කිසිදු ප්‍රතිලාභයක් නොලබන දේශීය රෙදිපිළි නිෂ්පාදකයින්ට රෙදිපිළි කර්මාන්තය සඳහා ව්‍යාපෘති ආශ්‍රිත යන්ත්‍රසූත්‍ර, අමතර කොටස් හා උපාංග තීරු බදු රහිතව ආනයනය කිරීමට අනුමතිය දී ඇත. මීට අමතරව කුඩා පරිමාණයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් අවම ආයෝජන අවශ්‍යතාවය වන රුපියල් දශ ලක්ෂ 5 සපුරාලන දේශීය හෝ අපනයන වෙළෙඳපොළ අරමුණු කර ගත් රෙදිපිළි හා ඒ හා සම්බන්ධ කර්මාන්තවලට ආයෝජන මණ්ඩල තත්ත්වයන් ලබා ගැනීමට අවසර දෙන ලදී. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශීය රෙදිපිළි පංගු බෙද වෙන් කිරීමේදී කමිටුව යෝජිත මිළදී ගැනීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. යෝජිත සැළැස්ම මගින් රජයේ දෙපාර්තමේන්තු කිහිපයක් සහ ආරක්ෂක අංශ වෙත අවශ්‍ය රෙදිපිළි සැපයීම අරමුණු

**4.13 සංඛ්‍යා සටහන**

**උසස් තාක්ෂණය දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ 1999 අවසානය වනවිට අනුමත කළ ව්‍යාපෘති(අ)**

| කාණ්ඩය | නව | | | දැනට පවත්නා | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ආයෝජන (රු.ද.ල.) | අපේක්ෂිත රැකියා අවස්ථා | සංඛ්‍යාව | ආයෝජන (රු.ද.ල.) | අපේක්ෂිත රැකියා අවස්ථා | සංඛ්‍යාව | ආයෝජන (රු.ද.ල.). | අපේක්ෂිත රැකියා අවස්ථා |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 25 | 2,558 | 1,981 | 74 | 6,771 | 4,557 | 99 | 9,329 | 6,538 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 14 | 761 | 1,520 | 44 | 1,876 | 2,829 | 58 | 2,637 | 4,349 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 7 | 268 | 567 | 10 | 210 | 520 | 17 | 478 | 1,087 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 11 | 662 | 914 | 38 | 1,871 | 1,588 | 49 | 2,533 | 2,502 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 50 | 2,500 | 2,825 | 126 | 5,575 | 6,430 | 176 | 8,075 | 9,255 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 10 | 1,714 | 811 | 11 | 697 | 803 | 21 | 2,411 | 1,614 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 6 | 1,012 | 824 | 18 | 1,086 | 951 | 24 | 2,098 | 1,775 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 20 | 1,069 | 1,455 | 52 | 2,726 | 2,837 | 72 | 3,795 | 4,292 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 22 | 1,768 | 2,015 | 22 | 804 | 818 | 44 | 2,572 | 2,833 |
| 10. සේවා | 14 | 575 | 776 | 23 | 4,054 | 1,628 | 37 | 4,629 | 2,404 |
| එකතුව | 179 | 12,887 | 13,688 | 418 | 25,670 | 22,961 | 597 | 38,557 | 36,649 |

(අ) තාවකාලික

මූලය : කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

කර තිබුණද 1999 දී අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ රෙදිපිළි අවශ්‍යතාවයන් සඳහා පමණක් පංගු වෙන් කර දී තිබුණි. වසර තුළදී දේශීය රෙදිපිළි නිෂ්පාදකයින් 6 දෙනෙකුට රෙදි මීටර දශ ලක්ෂ 3.9 ක පමණ පංගු වෙන් කර දී තිබුණි.

කර්මාන්ත සහ අපනයන පදනම විවිධාංගීකරණය අරමුණු කරමින් විද්‍යුත් සහ විදුලි උපකරණ එකලස් කිරීමේ උපාංග, පිඟන් සහ වීදුරු භාණ්ඩ, රබර් හා රබර් ආශ්‍රිත කර්මාන්ත, ලුහු සහ බැර ඉංජිනේරු කර්මාන්ත, මැණික් සහ දියමන්ති කැපීම, ඔප දැමීම හා නිෂ්පාදනය වැනි කර්මාන්ත ප්‍රමුඛතාව දිය යුතු කර්මාන්ත ලෙස ප්‍රකාශයට පත් කොට එම කර්මාන්ත සඳහා විශේෂ දිරි ගැන්වීම් හඳුන්වා දෙනු ලැබිනි. අවම ආයෝජනය රුපියල් දශ ලක්ෂ 50 ක් සහිත නව රැකියා අවස්ථා 50 ක් සැපයිය හැකි, නිමැවුමෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන සහ නම් කරන ලද කලාපයක අළුතෙන් පිහිටුවන ව්‍යවසායයන් දස අවුරුදු බදු විරාමයකට හා අනෙකුත් ආයෝජන මණ්ඩලීය දිරි ගැන්වීම් හා සහන ලැබීමට සුදුසුකම් ලබයි. ප්‍රමුඛතාව දිය යුතු යයි හඳුනාගත් කර්මාන්තයන්හි තියැලී සිටින ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යවසායකයන්ට ඔවුන්ගේ දැනට පවත්නා කම්හල් නවීකරණය කිරීම සඳහා තීරු බදු රහිතව යන්ත්‍රෝපකරණ ආනයනය කිරීමට අවසර දී ඇත. මෙම තීරු බදු සහනයන්ට අමතරව වසර 5 ක් තුළ අපනයන අවශ්‍යතාවයන්ගෙන් සියයට 50 ක් සපුරාලන ව්‍යවසායයන්ට පස් අවුරුදු බදු විරාමයක් ප්‍රදනය කර ඇත. අපනයන අවශ්‍යතාවයන්ගෙන් සියයට 90 ක් සපුරාලන ව්‍යවසායයන්ට සම්පූර්ණ ආයෝජන මණ්ඩල තත්ත්වයන් හා දස අවුරුදු බදු විරාමයක් ප්‍රදනය කෙරේ. ප්‍රමුඛතා දිය යුතු කර්මාන්ත ආයතනයන්හි ප්‍රකාශයට පත් නොකළ සමුච්චිත ආදයම් ආයෝජනය කරනු ලබන පුද්ගලයින්ට බදු/විනිමය පාලන සහනද ප්‍රකාශයට පත් කරනු ලැබිනි.

1998 අයවැය යෝජනා මගින් හඳුන්වා දෙන ලද කර්මාන්ත භූගෝලීය වශයෙන් ව්‍යාප්ත කිරීම දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමය 1999 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කරන ලදී. මෙම යොජනා ක්‍රමය යටතේ යම් ව්‍යවසායකයකු ව්‍යාප්ති ඒකකයක් 1999 දෙසැම්බර් 31 දිනට ප්‍රථම දුෂ්කර හෝ වඩාත් දුෂ්කර යයි හඳුනා ගත් ප්‍රදේශයක කර්මාන්ත නැවත පිහිටුවන අවස්ථාවලදී සහ එම ව්‍යවසයේ නිමැවුමෙන් අවමය සියයට 50 කට වඩා අපනයනය කරනු ලබන, සහ අවම වශයෙන් පුද්ගලයන් 150 ක් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවලදී වූ එවැනි ව්‍යවසායයන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ආයෝජන මණ්ඩලය මගින් පිරිනමනු ලබන දිරි දීමනා ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත. මෙම යෙ1ජනා ක්‍රමය යටතේ ඇඟළුම් කර්මාන්තය සම්බන්ධයෙන් අවම අපනයන අවශ්‍යතාවය සියයට 90 වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ "දුෂ්කර" යයි හඳුනා ගත් ප්‍රදේශයක හෝ "වඩාත් දුෂ්කර" යයි හඳුනා ගත් ප්‍රදේශයක ව්‍යාප්ති ඒකකයක් පිහිටුවන හෝ නැවත පිහිටවනු ලබන ව්‍යවසායන් සඳහා පස් අවුරුදු සිට අට අවුරුදු දක්වා බදු විරාමයක් ලැබීමට සහ අනෙකුත් ආයෝජන මණ්ඩලීය දිරි ගැන්වීම් ලැබීමට සුදුසුකම් ලබනු ඇත. 1999 දෙසැම්බර් 31 දිනට පෙර ව්‍යාප්ති ඒකක පටන් ගන්නා සහ අවම වශයෙන් පුද්ගලයින් 100 කට සේවා නියුක්තිය සලසන, දැනටමත් "දුෂ්කර" හෝ "වඩාත් දුෂ්කර" යයි හඳුනා ගත් ප්‍රදේශවල පිහිටා ඇති ඇඟළුම් හා ඒ ආශ්‍රිත නිෂ්පාදනයන්හි නියුතු ආයෝජකයන් සහ විශේෂ පුහුණු කිරීමේ ආයතන සඳහා අතිරේක 5 අවුරුදු බදු විරාමයක් ලැබෙනු ඇත.

### ජාතික ඵලදායිතා දශක වැඩසටහන

පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් 1997 දී ප්‍රකාශයට පත් කරන ලද ජාතික ඵලදායිතා දශකය වැඩසටහන (1997 - 2006) 1999 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. 1999 වසරේ තේමාව වූයේ සේව්‍ය සේවක සහයෝගීතාව තුළින් ඵලදායීතා වර්ධනය යන්නය. මෙය වැඩ බිමෙහි සාමය හා සමගියේ ඇති දැඩි අවශ්‍යතාවය තුළින් හඳුනා ගැනිනි. ඵලදායිතා වර්ධනය සඳහා සේව්‍ය සේවක සහයෝගිතාවයෙහි වැදගත්කම හුවා දක්වමින් ගුවන් විදුලි සාකච්ඡා, සමූහ සාකච්ඡා, රූපවාහිනී වැඩසටහන් ගණනාවක් සංවිධානය කරනු ලැබිණ. යහපත් සේව්‍ය සේවක සම්බන්ධතාවයන් ගොඩ නැගීමට අවශ්‍ය කරුණු සාකච්ඡා කිරීම සඳහා සේව්‍ය/සේවක වෘත්තීය සමිති නිලධාරී මණ්ඩල, ප්‍රධාන ව්‍යාපාරිකයන්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රැස්වීම් සංවිධානය කරනු ලැබිනි. මෙයට අමතරව මෙම සංකල්පය පිළිබඳව රාජ්‍ය අංශයේ වෘත්තීය සමිති නිලධරයන් දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක්ද පවත්වනු ලැබිනි. ඵලදායිතාවය පිළිබඳ ගුවන් විදුලි සාකච්ඡා භාෂා තුනෙන්ම පවත්වනු ලැබිනි. ඉංග්‍රීසි වැඩසටහන් 51 ක් ද, සිංහල වැඩසටහන් 52 ක් ද, දෙමළ වැඩසටහන් 10 ක් හා ළමා වැඩසටහන් 52 ක් ද පවත්වනු ලැබිණ. 1999 දී ඵලදායීතාවය පිළිබඳ රූපවාහිනී වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලද අතර ඉංග්‍රීසි වැඩසටහන් 4 ක් හා සිංහල වැඩසටහන් 20 ක් විකාශනය කරන ලදී. ප්‍රාදේශීය දේශපාලන අධිකාරීන් ඇතුළු ප්‍රාදේශීය හා දිස්ත්‍රික්ක මට්ටමේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් ඵලදායිතාවය හා එහි භාවිතය පිළිබඳව දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ 6 ක් පවත්වනු ලැබිණ. වසර තුළදී අමාත්‍යාංශ හා අනුබද්ධිත ආයතනයන්හි නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු හා දේශනමාලාද සංවිධානය කරනු ලැබිණ.

## 4.8 කර්මාන්ත ස්ථානගත වීම

ප්‍රවාහන වියදම් අඩු කර ගැනීමට හා කාලය ඉතිරි කර ගැනීම සඳහා වරාය හා ගුවන්තොටුපලට ආසන්නව තමන්ගේ කර්මාන්තශාලා පිහිටුවීමට කර්මාන්තකරුවෝ සාමාන්‍යයෙන් වැඩි කැමැත්තක් දක්වති. මෙම කරුණ සහ බියගම සහ කටුනායක අපනයන කලාපයන් යටතේ සාපේක්ෂ වශයෙන් වඩාත් යහපත් යටිතල පහසුකම් තිබීම සහ ඉහල දිරි දීමනා පැවැතිම නිසා කර්මාන්තකරුවෝ තමන්ගේ කර්මාන්තශාලා ගම්පහ සහ කොළඹ

දිස්ත්‍රික්කයන්හි ස්ථානගත කිරීමට පෙළඹුනහ. 1999 අවසානය වනවිට ආයෝජන මණ්ඩල පනතේ 16 හා 17 වගන්ති යටතේ සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ කර්මාන්තයන්ගෙන් සියයට 75 කට ආසන්න ප්‍රමාණයක් මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ස්ථානගත කර තිබුණි. මෙම දිස්ත්‍රික්ක දෙකෙහි අධික ලෙස කර්මාන්ත ඒකරාශී වීම නිසා ශ්‍රම හිඟය, මාර්ග තදබදය හා අබලන් වීම, ඉඩම් මිල ඉහළ යාම, පරිසර දූෂණය හා බස්නාහිර පළාතේ ප්‍රධාන නගරයන්හි පවතින තදබදය වැනි ප්‍රශ්න පැන නැගී ඇත. අතීතයේදී රජය මගින් කර්මාන්ත රට පුරා ව්‍යාප්ත කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන තිබුණද, බස්නාහිර පලාතෙන් පිටත යටිතල පහසුකම් ප්‍රමාණවත් මට්ටමක නොතිබීම මෙම ප්‍රදේශවලට ආයෝජකයන් ඇද ගැනීම සඳහා ප්‍රධාන බාධාකයක්ව පවතී. මෙම ගැටළු නිරාකරණය කර ගැනීමේ හදිසි අවශ්‍යතාවය හඳුනා ගනිමින් රජය විසින් මෑතදී කාර්මික උද්‍යාන සංවර්ධන වැඩසටහන්, ඇඟළුම් කම්හල් 50 වැඩසටහන, දක්ෂිණ ලංකා සංවර්ධන වැඩසටහන, කුඩා ප්‍රමාණයේ අපනයන සැකසුම් කලාප වැනි ප්‍රධාන පෙලේ වැඩසටහන් කිහිපයක් දියත් කරනු ලැබිණ. වසර තුළදී රජය අපනයන සැකසුම් කලාප, කර්මාන්තපුර හා කාර්මික උද්‍යානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් දශ ලක්ෂ 1,400 කට ආසන්න මුදලක් වෙන් කොට ඇත. රටේ දුෂ්කර ප්‍රදේශයන්හි කර්මාන්ත පිහිටුවීම උනන්දු කිරීම සඳහා රජය විවිධ ආකාරයේ බදු හා මූල්‍ය දිරි ගැන්වීම් සලසන ලදී.

ආයෝජන මණ්ඩලය විසින් ප්‍රාදේශීය වශයෙන් යටිතල පහසුකම් සලසමින් මල්වත්ත, මීරිගම, වතුපිටිවල, පොල්ගහවෙල, මාවතගම හා හොරණ යන ස්ථානවල කුඩා අපනයන සැකසුම් කලාප පිහිටවනු ලැබිණ. කර්මාන්ත ඒකක 16 ක් පිහිටුවීමට ඉඩ පහසුකම් ඇති මාවතගම කුඩා අපනයන සැකසුම් කලාපයෙන් ආවරණය වන මුළු බිම් ප්‍රමාණය අක්කර 48 කි. අක්කර 36 ක භූමි භාගයක වූ පොල්ගහවෙල කුඩා අපනයන සැකසුම් කලාපය කම්හල් 12 කට ඉඩකඩ සලසනු ඇත. අක්කර 412 ක ව්‍යාප්තව ඇති හොරණ කුඩා අපනයන සැකසුම් කලාපයෙහි ආයෝජන ව්‍යාපෘති 60 ක් සඳහා ඉඩකඩ ඇත. මෙම ව්‍යාපෘති වලින් පුද්ගලයින් 25,000 කට සේවා නියුක්ති අවස්ථා සැලසෙන බව ඇස්තමේන්තු කර ඇත. හොරණ කර්මාන්තපුර ව්‍යාපෘතිය කර්මාන්තශාලාවලට අමතරව නිවාස යෝජනා ක්‍රම, වෙළඳ සංකීර්ණ, බැංකු, හෝටල සහ ක්‍රීඩා පහසුකම් වලින්ද සමන්විතය. මල්වත්ත කුඩා අපනයන සැකසුම් කලාපය ඉදි කිරීමේ කටයුතු නිම වූ පසු කර්මාන්තශාලා 11 ක ට ඉඩකඩ සලසනු ඇත. මෙම ව්‍යාපෘතියෙන් සැලසිය හැකි සේවා නියුක්ති ප්‍රමාණය පුද්ගලයින් 5,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. අක්කර 90 ක ට අධික බිම් ප්‍රමාණයක ව්‍යාප්තව ඇති මීරිගම කුඩා අපනයන සැකසුම් කලාපයෙහි කර්මාන්ත ඒකක 15 ක් සඳහා ඉඩකඩ ඇත. මෙම උද්‍යානයෙහි ඉදි කිරීම් කටයුතුවල ප්‍රථම අදියර 1999 මැද භාගය වනවිට සම්පූර්ණ කර තිබුණි. අක්කර 67 ක් වූ භූමිභාගයක පිහිටි වතුපිටිවල කුඩා අපනයන සැකසුම් කලාපය කර්මාන්ත ඒකක 20 කින් සමන්විතය.

කාර්මික ජනපද/උද්‍යාන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මූලික යටිතල පහසුකම් සලසමින් කාර්මික උද්‍යාන කිහිපයක් පිහිටවනු ලැබිණ. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය වාර්තා කරණ පරිදි කාර්මික ජනපද 9 ක සංවර්ධන කටයුතු දැනටමත් සම්පූර්ණ කර ඇති අතර තවත් කාර්මික ජනපද හයක සංවර්ධන කටයුතු නිම වීමට ආසන්නව පවතී. තවත් වැඩ බිම් හයක් නුදුරු අනාගතයේදී සංවර්ධනය කර නිම කිරීමට නියමිතය. මෙම සියළු කාර්මික ජනපදයන්හි සංවර්ධන කටයුතු නිම වූ පසු එමගින් කර්මාන්ත ඒකක 390 ක ට ඉඩකඩ සැලසෙන අතර එමගින් සැලසෙන සෘජු හා වක්‍ර සේවා නියුක්ති ප්‍රමාණය පුද්ගලයින් 121,200 කි. දංකොටුව, මාකඳුර, කුරුවිට, කරන්දෙනිය, උඩුකාව, මිනුවන්ගොඩ, හෝමාගම, බෙලිඅත්ත, මඩවල-උල්පත, ලක්ෂඋයන, නවගම්පුර සහ කොලොන්නාව යන කාර්මික ජනපදයන්හි ආයෝජනය කිරීමට අදහස් කර ඇති ආයෝජකයන්ට ඔවුන්ගේ කර්මාන්ත ඒකක පිහිටුවීම සඳහා ඉඩම් කැබලි වෙන් කර දීම දැනටමත් ආරම්භ කර ඇත. 1999 අවසානය වනවිට ආයෝජකයන් සඳහා බිම් කැබලි 106 ක් වෙන් කර දී තිබිණි. පුද්ගලයින් 5,500 කට සේවා නියුක්තිය සලසමින් ව්‍යාපෘති 40 ක් මෙම කාර්මික ජනපදයන්හි වාණිජ කටයුතු ආරම්භ කර ඇත. 1999 දෙසැම්බර් අවසානය වනවිට තවත් කම්හල් ගොඩනැගිලි 23 ක් ඉදි කිරීමේ තත්ත්වයේ පැවතින. මෙම වැඩසටහන්වලට අමතරව කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටවනු ලැබිණ. මෙම වැඩසටහන යටතේ පළමුවැනි විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය දිවුලපිටියේද, දෙවැන්න දඹුල්ලේද පිහිටුවනු ලැබූ අතර ඇඹිලිපිටිය, මොණරාගල, කැප්පෙටිපොල සහ පමුණුව නගරයන්හිද මෙවැනි මධ්‍යස්ථාන පිහිටුවීමේ හැකියාව පිළිබඳ මූලික අධ්‍යයන කටයුතු කෙරෙමින් පවතී. කැප්පෙටිපොල මධ්‍යස්ථානයෙහි ඉදි කිරීම් කටයුතු සියයට 90 ක් පමණ දැනටමත් නිම කර ඇති අතර 2000 මාර්තු මස අවසානයට පෙර මෙහි කටයුතු සම්පූර්ණයෙන්ම නිම කිරීමට අපේක්ෂා කෙරේ. මෙම මධ්‍යස්ථානයෙහි එළවළු අලෙවිහල් 100 ක් හා ගොවියන්ට ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා විවෘත ගොඩනැගිලි 2කට ද පහසුකම් සැලසෙනු ඇත.

අක්කර 415 ක බිම් ප්‍රමාණයක ව්‍යාප්ත වූ සීතාවක කර්මාන්ත උද්‍යානයෙහි කම්හල් 71 ක ට පහසුකම් සැලසිය හැකිය. මෙම ව්‍යාපෘතියෙන් සැපයෙන සෘජු සේවා නියුක්ති ප්‍රමාණය පුද්ගලයින් 20,000 ක් ලෙස ද වක්‍ර සේවා නියුක්ති ප්‍රමාණය පුද්ගලයින් 25,000ක් ලෙසද ඇස්තමේන්තු කර ඇත. 1999 දෙසැම්බර් අවසානය වන විට ආයෝජකයන්ට බිම් කැබලි 62 ක් වෙන් කර දී තිබූ අතර කර්මාන්තශාලා 6 ක වාණිජ කටයුතු ආරම්භ වී තිබුණි. තවද ව්‍යාපෘති 25 ක් ක්‍රියාත්මක වීමේ විවිධ අදියරවල පසු විය. 1999 දෙසැම්බර් අවසානය වනවිට සීතාවක කාර්මික උද්‍යානය මුළු ආයෝජන රුපියල් දශ ලක්ෂ 6,812 ක් සහිතව පුද්ගලයින් 17,000 සේවා නියුක්තිය සලසමින් එක්සත් රාජධානිය, ජපානය, කැනඩාව, මලයාසියාව, ඉන්දියාව, කොරියාව, හොංකොං, ප්‍රංශ, බෙල්ජියම සහ ශ්‍රී ලංකාව යන රට වලින් ආයෝජකයන්

ඇද ගැනීමට සමත් විය.

1999 අවසානයේදී ප්‍රාදේශීය වශයෙන් පුළුල් ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ඇඟළුම් කම්හල් 200 වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 21 ක කර්මාන්තශාලා 167 ක් වාණිජ කටයුතුවල නිරතව සිටියහ. මෙම කර්මාන්තශාලා 167 න් 145 ක් හෙවත් සියයට 87ක් ම කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයන්ගෙන් පිටත ස්ථානගතව තිබුණි. මොණරාගල, අම්පාර, ත්‍රිකුණාමලය සහ මඩකලපුව වැනි "වඩා දුෂ්කර" දිස්ත්‍රික්කවල කර්මාන්තශාලා 11 ක් විය. 1999 දෙසැම්බර් අවසානයට රත්නපුර දිස්ත්‍රික්කයෙහි කම්හල් 16ක් ද, අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 14 ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි කම්හල් 12ක් ද විය. 1998 අයවැය යෝජනා මගින් හඳුන්වා දෙන ලද ඇඟළුම් කම්හල් 50 වැඩසටහන යටතේ 1999 දෙසැම්බර් අවසානය වනවිට ඇඟළුම් කම්හල් 51 ක් දිස්ත්‍රික්ක 18 ක වාණිජ කටයුතුවල නිරතව සිටි අතර ඉන් විශාල ප්‍රමාණයක් දකුණු පළාතෙහි විය. මෙයින් කම්හල් 21 ක් හෙවත් සියයට 42 ක් ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල පිහිටා තිබුණි. එමෙන්ම නව කර්මාන්ත පිහිටුවීම හා පවත්නා කර්මාන්ත සංවර්ධනය කිරීමේ අරමුණින් 1996 දී පිහිටවනු ලැබූ දක්ෂිණ ලංකා සංවර්ධන අධිකාරිය මගින් 1999 අවසානය වනවිට කර්මාන්ත 246 ක් අනුමත කර තිබුණි. 1999 අවසානය වනවිට මෙම කර්මාන්තයන්ගෙන් 205 ක් වාණිජ කටයුතුවල නිරතව සිටියහ. සියළුම සම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තශාලා එකම කාර්මික සංකීර්ණයක නැවත පිහිටුවීමේ අදහස ඇතිව කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය දකුණු පලාතේ බටඅත කාර්මික උද්‍යානයක් ආරම්භ කරනු ලැබිණ. මෙම සංකීර්ණය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය දනුමැතිය ලබා දී ඇත. 1999 දී බටඅත අප ද්‍රව්‍ය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරයක් පිහිටුවීම සඳහා රුපියල් දශ ලක්ෂ 65 ක් ලබා දීමට නෝර්වේ රජය එකඟ වී ඇත. 1999 අගෝස්තු මාසයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සම් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාවන් සොයා බැලීම සඳහා අධ්‍යයනයක් කිරීම ආරම්භ කරන ලදී.